
මෛත්‍රී
පාලනයක්...
ස්ථාවර රටක්

ප්‍රතිපත්ති ප්‍රකාශනය

# මෛත්‍රී

## පාලනයක්...
## ස්ථාවර රටක්

නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ

මෛත්‍රීපාල සිරිසේන

# පටුන


| | | |
|---|---|---|
| | මගේ දැක්ම | 06 |
| | ඉදිරි මග | 11 |
| 01 | ප්‍රජාතන්ත්‍රවාදය සහතික කරන ව්‍යවස්ථා සංශෝධනයක් | 13 |
| 02 | රට නංවන ආර්ථිකයක් | 19 |
| 03 | සදාචාර සම්පන්න සමාජයක් | 23 |
| 04 | සුරක්ෂිත ආහාර හා තිරසාර ගොවිතැනක් | 29 |
| 05 | සැමට සුව සෙත | 35 |
| 06 | නව අභියෝග ජයගන්නා නිදහස් අධ්‍යාපනයක් | 39 |
| 07 | රට රැකෙන ජාත්‍යන්තර සබඳතා | 43 |
| 08 | විරැකියාව දුරු කරන කර්මාන්ත හා සේවා | 47 |
| 09 | දියුණු රාජ්‍ය අංශයක් | 51 |
| 10 | බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක් | 55 |
| 11 | අර්ථවත් හරවත් මාධ්‍ය නිදහසක් | 61 |

| | |
|---|---|
| පරි. අංකය | 6721 |
| වර්ග අංකය | 3906.6 |
| දිනය | |

## ගෞරවනීය ස්වාමීන් වහන්ස,
## හින්දු, ඉස්ලාම්, කිතුණු පූජක තුමනි,
## දයාබර මිත්‍රවරුනි,

ප්‍රමුව ඔබ සැමට මෛත්‍රීය රජයන සමාජයක් හෙට දිනයේ උදා වේවායි ප්‍රාර්ථනා කරමි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් ලෙස මා දැරූ වගකිවයුතු ඇමති ධුර හා මා ඉදිරියේ පෙන්වනු ලැබූ අගමැති ධුරය ආදී සියල්ල පසෙක ලා මාගේ සහ මගේ පවුලේ සාමාජිකයන්ගේ ජීවිත අවදානම ද නොතකා, එළැඹෙන ජනාධිපතිවරණයට ඉදිරිපත් වූයේ මගේ උදාර මව්බිමටත්, සමස්ත ජනතාවටත් අත්ව ඇති ඛේදජනක ඉරණමින් ඔවුන් ගලවා ගනු පිණිසය.

එහි දී, මාගේ අපේක්ෂකත්වය වෙනුවෙන් කැප වූ, දේශමාමක, සදාචාරවත් සමාජයක් පතන සියලු බෞද්ධ භික්ෂූන් වහන්සේලාටත්, ශීලාචාර සමාජයක් වෙනුවෙන් කැප වූ හින්දු, ඉස්ලාම්, කිතුණු පූජකතුමන්ලා සහ ආගමික නායකයින්වත් මගේ නමස්කාර පූර්වක ගෞරවය පිරිනමමි. එමෙන්ම, සිය පක්ෂ, ලාංඡන, පාට අමතක කර එකම ජාතික කර්තව්‍යයක් වෙනුවෙන් එක් වූ විපක්ෂ නායකතුමා ඇතුළු සියලු පක්ෂවල නායක කාරකාදීන්ට හා පක්ෂ සාමාජිකයන්ට මාගේ ගෞරවණීය ප්‍රණාමය පිරිනමමි. තවද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පවුල්කාමයෙන් ගලවා ගැනීම සඳහා මා සමඟ එක්වූ සහෘදයින් සියලු දෙනාට ද මගේ ප්‍රණාමය පිරිනමමි.

සිය ජීවිතය මේ රටේ දුක් විඳින ගොවි, කම්කරු, ධීවර ජනයාගේ සුබසෙත වෙනුවෙන් ද නීති, වෛද්‍ය, ඉංජිනේරු, ගණකාධිකාරී ආදී වෘත්තීය ප්‍රජාවගේ අභිලාෂයන් වෙනුවෙන් ද කාන්තාවන්, දරුවන්, වැඩිහිටියන් හා විශේෂ අවශ්‍යතා ඇත්තන් වෙනුවෙන් ද මතු පරපුර වෙනුවෙන් ද පරිසරය සුරැකීම වෙනුවෙන් ද කැප වූ සියලු සමාජ ක්‍රියාකාරීන් හා ස්වේච්ඡා සංවිධාන මා වෙත පළ කළ සහෝදරත්වයේ දෑත පිළිබඳ මගේ මිත්‍රශීලී සුහදතාව ද දක්වා සිටින්නෙමි.

# මගේ දැක්ම

'දූෂණ හා වංචා සැමදා සිදු වූ බව සත්‍යයකි. එහෙත් පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ සිදු වූ දූෂණවල පරිමාණය ඉතිහාසයේ කිසිදු දිනෙක අසන්නට ලැබී නැත. රට ගොඩනංවන ඒකාබද්ධ වැඩපිළිවෙලක් සඳහා ප්‍රධාන දේශපාලන පක්ෂ කිහිපය එක් කරගත හැකි ඓතිහාසික මොහොත දැන් උදාවී ඇත.'



1994 සිට අද දක්වා අපේ රට සමස්තයක් ලෙස පාලනය කරනු ලැබුයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධාන රජයන්ය. එදා මෙදා තුර මේ රටේ දැවෙන ප්‍රශ්න රාශියක් විසදීමට අපට හැකි විය. එම ගමන් මගේ සාර්ථකත්වය සඳහා දායකවීමට පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා ලෙස මා හට ද අවස්ථාව ලැබීම ගැන මම අතිශය සතුටු වෙමි. එම ජයග්‍රහණයන් අතර ශ්‍රී ලංකාව, තම මෑත ඉතිහාසයේ දශක තුනක් තිස්සේ මුහුණ දුන් බරපතලම සමාජ දේශපාලන අභියෝගය වූ ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම ද වන බව මුළු මහත් රටම දන්නා කරුණකි.

එම යුද ජයග්‍රහණයට මේ වන විට වසර පහක් ගතවී ඇති නමුත් මෙතෙක් ශ්‍රී ලංකාව මුහුණ දී සිටින සෙසු අතිශය බරපතල සමාජ, දේශපාලන සහ ආර්ථික අර්බුද ජයගැනීමේ මාවතට සාර්ථකව පිවිසීමට අපට නොහැකි විය. ඇත්ත වශයෙන්ම සිදු වූයේ අනපේක්ෂිත ලෙස එම අර්බුද තව තවත් දරුණු වීමයි. මතු වූ මෙම නව වඩාත් දරුණු අර්බුද විසඳා ගැනීමෙන් තොරව අප රටට තවදුරටත් ඉදිරියට යාමට නොහැක.

නීතියේ ආධිපත්‍යය සහමුලින්ම බිඳ වැටීම, වංචාව, දූෂණය, නාස්තිය, ජාතික ප්‍රමුඛතාවන් හඳුනා නොගැනීම, පරිසර විනාශය, සදාචාර හා අධ්‍යාත්මික පරිහානිය ආදී අවගමනයන් රැසක් අද අප රටේ ඉදිරි ගමනට බාධාකාරී ලෙස මතු වී ඇත. දූෂණ හා වංචා සැමදා සිදු වූ බව සත්‍යයකි. එහෙත් පසුගිය වසර කිහිපය තුළ සිදු වූ දූෂණවල පරිමාණය ඉතිහාසයේ කිසිදු දිනෙක අසන්නට ලැබී නැත. ගමේ ගොඩේ බෝක්කුව තැනීමේ සිට, අධිවේගී මාර්ග, විදුලි බලාගාර, ගුවන් තොටුපොලවල් තැනීම ආදී සෑම මට්ටමකදීම මෙම තත්වය අත් විඳින්නට ලැබිණි. මින් පෙර කථා කලේ සියයට දහයේ කොමිස් ගැනය. දැන් කථා කරන්නේ සියයට අනුවේ කප්පම් ගැනය. දැන් බෝක්කු හැදීමට සැබැවින්ම රුපියල් ලක්ෂයක් වැය කළේ නම් ගසා කෑ ප්‍රමාණය ලක්ෂ 9 ක් විය. කඩවත-කෙරවලපිටිය අධිවේගී මාර්ගයේ කිලෝ මීටරයකට සමස්තයක් ලෙස රුපියල් කෝටි 730 වැය කරන්නේ නම් ඉන් ගසා කන ප්‍රමාණය රු කෝටි 520ක් පමණ වේ.

මේවා විදේශ රටවලින් ණයට ගත් මුදල්ය. මෙම මෙගා කප්පම් මුදල යන්නේ කිහිපදෙනෙකු අතටය. අපේ දරු මුණුපුරන් පරම්පරා ගණනාවකට මෙම ණය ගෙවා නිම කළ නොහැක. එලෙස ණය ගෙවාගන්නට බැරි වූ විට සිදු වන්නේ රට හා දේපළ උගස සින්න වීමයි. එනම් අපේ මහපොළව හා දේපො විදේශිකයන්ගේ අතට පත් වීමයි. සුද්දාගේ කාලයේ අවි බලයෙන් ලබාගත් භූමිය මේ කාලයේ රට කරන කිහිපදෙනෙකුට කප්පම් දී විදේශිකයෝ ලබාගනිමින් සිටිති. මෙම මංකොල්ලය අමු අමුවේම සියලු දෙනාගේම ඇස් ඉදිරිපිට සිදුවෙමින් තිබේ. එහෙත් මැර බලය හමුවේ ජනතාවට ඇස් කන් පියා ගෙන නෑසූ කන්ව සිටීමට සිදුවිය. මේ වනවිට අප රට ආසියාවේ ආකර්ෂණීය රටක් ලෙස බිහිකර ගැනීම වෙනුවෙන් දෙදහස් නවය වසරේදී දැල්වුණු සියලු ජාතික බලාපොරොත්තු වියැකී ගොස් ඇත. තවත් වසර හයක් මේ විදියට රට ගමන් කළොත් මුළු රටම යටත් විජිතයක් වී අපි අපේ මව්බිමේම වහලුන් බවට පත්වනු නිසැකය.

අද වන විට රටේ නීතිය කිහිපදෙනෙකුගේ ඕනෑ එපාකම් අනුව නැටවෙන තත්වයක් තුළ වැරදි හා බොළඳ විදේශ ප්‍රතිපත්ති හා උපක්‍රම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ද බරපතල ලෙස විනාශ

වී ගොස් ඇත. ශ්‍රී ලංකාව, ජාත්‍යන්තරය තුළ ශීඝ්‍රයෙන් හුදකලා වෙමින් තිබේ. ආසියාවේ ආශ්චර්යය බවට පත්වීම කෙසේ වෙතත් ලෝක බලවතුන්ගේ ආසියාවේ පොර පිටිය බවට ශ්‍රී ලංකාව පත්වෙමින් තිබේ.

අප රට දැන් අවතීර්ණ වෙමින් තිබෙන්නේ ඉතිහාසයේ තීරණාත්මක සන්ධිස්ථානයකටය. රට, සාමයේ සෞභාග්‍යයේ සහ සංහිඳියාවේ තෝතැන්නක් දෙසට හරවනවාද නොඑසේනම් පරාභවයේ අස්ථාවරත්වයේ සහ අරාජිකත්වයේ අගාධය දෙසට හරවනවාද යන්න තීරණය වන්නේ සැබෑ ලෙස රටට ආදරය කරන ඔබ සැම අද දවසේ කටයුතු කරන ආකාරය අනුවය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වූ මා මෙවර ජනාධිපතිවරණයට රටේ ජනතාවගේ පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත්වීමට තීරණය කළේ රට මුහුණ දී ඇති මෙම දැවැන්ත ප්‍රශ්නවලට ඉදිරි වසර කීපය තුළ දී විසඳුම් ලබා දී ස්ථාවර සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම උදෙසාය. අද රටට අත්‍යාවශ්‍ය දේශපාලන පක්ෂ අතර සමඟිය ගොඩනැඟීම උදෙසා මම ඇප කැප වෙන්නෙමි. ප්‍රධාන දේශපාලන පක්ෂ රට ගොඩනංවන ඒකාබද්ධ වැඩපිළිවෙලක් වෙනුවෙන් එක් කරගත හැකි ඓතිහාසික මොහොත දැන් උදාවී ඇත. එම භාරධූර කර්තව්‍යය සාක්ෂාත් කර ගැනීම උදෙසා මා හා එක්වී සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්භීත නායකයින්, සාමාජිකයන් මෙන්ම එක්සත් ජාතික පක්ෂය, ජාතික හෙළ උරුමය, ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ඇතුළු සියලු දේශපාලන පක්ෂවල නායකයින්හට මාගේ ගෞරවය හා ප්‍රණාමය පුදකිරීමට කැමැත්තෙමි.

මා සමඟ එක් වී සිටින දේශපාලන නායකයින් හා ජනතාව සමඟ මම අදියර දෙකකින් රට ස්ථාවර කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නෙමි. පළමු අදියර නම් ක්ෂණික ගැටළු විසඳීම උදෙසා වන දින සියයක කඩිනම් වැඩසටහනයි. ඒ සඳහා දින සියයක අන්තර් කාලයක් සඳහා ජාතික සමඟි සන්ධාන ආණ්ඩුවක් පිහිටුවමි. එම වැඩසටහන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය, ජාතික හෙළ උරුමය හා මෙම වැඩසටහන සමඟ එක් වීමට කැමති වත්මන් පාර්ලිමේන්තුව නියෝජනය කරන සෙසු දේශපාලන පක්ෂවල මහජන නියෝජිතයන්ගෙන් ද සමන්විත වන ජාතික ආණ්ඩුවක් හරහා ක්‍රියාත්මක කරන්නෙමි. එම ජාතික ආණ්ඩුවේ අගමැතිවරයා ලෙස වත්මන් විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාව පත් කරන්නෙමි.

දෙවනුව ස්ථාවර, පතිරූප දේශයක් බිහි කිරීම උදෙසා හය අවුරුදු වැඩසටහන, දින සියයකින් පසු පැවැත්වෙන මහ මැතිවරණයෙන් බලයට පත්වන ආණ්ඩුව සමඟ එක්වී ක්‍රියාත්මක කරන්නෙමි. මට කිසිදු බල තණ්හාවක් නැත. මා විසින් මේ ඉටු කරනු ලබන්නේ රට ගොඩනැඟීම හා රට ස්ථාවරභාවයට පත්කිරීම සඳහා මා හට පැවරී ඇති ඓතිහාසික කාර්යභාරයයි.

# ඉදිරි
# මග

# 01.
# ප්‍රජාතන්ත්‍රවාදය සහතික කරන ව්‍යවස්ථා සංශෝධනයක්

**'ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක් සහිතව සම්මත කිරීම සඳහා නායකත්වය ලබා දිය යුතුව ඇත්තේ ජනාධිපතිවරයා විසින්ය. මා මෙවර ජනාධිපතිවරණයට රටේම ජනතාවගේ පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වීමට තීරණය කළේ මෙම කර්තව්‍යය සම්පූර්ණ කරලීම සඳහාය.'**

1994 සිට මේ දක්වා අඛණ්ඩවම අප පක්ෂය විසින් රටටත් ජනතාවටත් පොරොන්දු වූ 1978 සිට පැවති විධායක ජනාධිපති ක්‍රමය ව්‍යවස්ථාමය වශයෙන් වෙනස් කිරීමට අපහට නොහැකි විය. වසර 20ක් තිස්සේ එම අරමුණ සාක්ෂාත් කරගැනීමට නොහැකිවීම අප ලද බලවත් පරාජයකි. එය තව දුරටත් ප්‍රමාද කළ නොහැකිය.

## ■ අසීමිත බලතල සහිත විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම

විධායක ජනාධිපතිධුරය වෙනස් කිරීමට ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ සහයෝගය අවශ්‍ය වේ. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ බලය ඇත්තේ පාර්ලිමේන්තුවට වන නිසාය. එසේ වුවද පසුගිය වසර විස්ස තිස්සේම මෙම වෙනස්කම කිරීමට පාර්ලිමේන්තුවට නොහැකි විය. ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක් සහිතව සම්මත කිරීම සඳහා නායකත්වය ලබා දිය යුතුව ඇත්තේ ප්‍රධාන පක්ෂයේ නායකයා වූ ජනාධිපතිවරයාය. එහිදී

---

**දැනට පවතින අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට අළුතෙන් කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුව හා සම්බන්ධ වූ විධායකයක් සහිත ආණ්ඩුක්‍රම ව්‍යුහයක් හඳුන්වා දෙමි.**

---

ජනාධිපතිවරයාගේ මූලිකත්වයෙන් ප්‍රධාන පක්ෂ අතර මෙම සංශෝධනය පිළිබඳව එකඟතාවක් ඇති කරගත යුතුය. මා මෙවර ජනාධිපතිවරණයට රටේම ජනතාවගේ පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත්වීමට තීරණය කළේ මෙම කර්තව්‍යය සම්පූර්ණ කරලීම සඳහාය.

මෙම ව්‍යවස්ථා සංශෝධනය සඳහා පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් හිමි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සහය ලබාගැනීමට මාහට හැකිය. එමෙන්ම, එම සංශෝධනය සිදු කිරීම සඳහා එක්සත් ජාතික පක්ෂය මා සමඟ ගිවිසුම් ගත වී ඇත. ජනතා විමුක්ති පෙරමුණ 1994 සිටම මේ පිළිබඳව අප පක්ෂය සමඟ එකඟ වී ඇත. ජාතික හෙළ උරුමය ද මීට සහය දක්වන බවට ගිවිසුමකින් මා සමඟ එකඟ වී ඇත. එම නිසා සෙසු පක්ෂ සමඟ ද සාකච්ඡා කර දින සියයක් ඇතුළත මෙම සංශෝධනය අනිවාර්යයයෙන්ම සිදු කරන්නෙමි.

විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීම සඳහා මා විසින් පසුබිම් කරගනු ලබන්නේ පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමි ප්‍රමුඛ සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරය විසින් ඇති කරගෙන තිබෙන විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා වූ එකඟතා හා පූජ්‍ය අතුරලියේ රතන හිමි ප්‍රමුඛ පිවිතුරු හෙටක් ජාතික සභාව විසින් සම්පාදනය කර ඇති 19 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතින් ඉදිරිපත් කර ඇති ජනාධිපති-අගමැති ව්‍යවස්ථාමය සන්ධානයක් පිළිබඳ වූ යෝජනාය. තවද, එක්සත් ජාතික පක්ෂය විසින් එම යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති යෝජනා ද සැලකිල්ලට ගනිමි.

නව ආණ්ඩුක්‍රම ව්‍යුහය අනිවාර්යයෙන්ම දැනට පවතින අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුව හා සම්බන්ධ වූ විධායකයක් සහිත ආණ්ඩුක්‍රම ව්‍යුහයක් වනු ඇත. එහිදී ජනාධිපතිවරයා නීතිය ඉදිරියේ අන් පුරවැසියන් හා සමානව සලකනු ඇත. පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනමත විචාරණයකින් පමණක් වෙනස් කළ හැකි ව්‍යවස්ථා වගන්තිවලට මෙම යෝජිත ව්‍යවස්ථා සංශෝධනයේ දී අත නොතබන බවට මම සහතික

වෙමි. එමෙන්ම රටේ ස්ථාවරභාවය, ආරක්ෂාව හා ස්වෛරීත්වය සඳහා ඇති ඉඩකඩ වැඩි දියුණු වන්නා වූ සංශෝධනයක් මිස ඊට හානිකර වන්නා වූ කිසිදු සංශෝධනයක් සිදු නොකරන බවට ද මම සහතික වෙමි.

**එමෙන්ම,**

- අමාත්‍ය මණ්ඩලයේ සංඛ්‍යාව, සංයුතිය හා ස්වභාවය විද්‍යාත්මක පදනමක සිට සිදු කරන්නෙමි.
- අමාත්‍යාංශ සඳහා පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය ශක්තිමත් කෙරේ.
- සියලු අමාත්‍යාංශ සඳහා කුසලතා ඇගයීමක් ස්වාධීනව සිදු කර එය පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ අධීක්ෂණයට යටත් කෙරේ.
- ප්‍රාදේශීය දේශපාලකයින් හා ඔවුන්ගේ හෙංචයියන් ඔවුන් සතු ඉහළින් ලැබුණු අනුග්‍රහ සහ දේශපාලන බලය මත වංචා, අල්ලස්, ස්ත්‍රී දූෂණ, මිනීමැරීම්වල නිරත වීම වලකාලීම සඳහා සියලුම මහජන නියෝජිතයින් විසින් පිළිපැදිය යුතු චර්යා ධර්ම සංග්‍රහයක් නීති ගත කෙරේ. මහජන නියෝජිතයින් විසින් සිදු කරනු ලබන අයුතු බලපෑම්, අයථා ක්‍රියා හා හැසිරීම්, මහජනයා පීඩාවට පත් කිරීම්, බිය වැද්දීම්, බලය අයුතු ලෙස යොදා ගැනීම, මහජන සේවා නොසළකා හැරීම හා පක්ෂග්‍රාහී ක්‍රියාකාරකම් වැලැක්වීමට අවශ්‍ය දැඩි පියවර ගනු ලැබේ.

## ■ මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම

අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ රජයට පසුගිය වසර විස්ස තුළ දී නිරාකරණය කිරීමට නොහැකි වූ අනෙක් බරපතල ප්‍රශ්නයක් වන්නේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමයි. පවතින මැතිවරණ ක්‍රමය දූෂණයට හා මැර ක්‍රියාවලට පොළඹවන ප්‍රධාන උල්පතකි. මනාප ක්‍රමය නිසා මැතිවරණය සඳහා අති විශාල ධනස්කන්ධයක් වැය කිරීමට අපේක්ෂකයන් හට සිදුවේ. මම මෙය සපුරා වෙනස් කරමි. එහි පරමාර්ථය වන්නේ මනාප ක්‍රමය අවසන් කිරීම හා සෑම මැතිවරණ කොට්ඨාසයකටම අනිවාර්යයයෙන්ම එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ සිටින බව සහතික වීමයි. මෙම ව්‍යවස්ථා සංශෝධනයේ දී කේවල ආසන ක්‍රමය හා පරාජිත අපේක්ෂකයන්ගේ සමානුපාත ඡන්දයේ සංකලනයක් භාවිතා වේ. මෙම යෝජනාව මඟින් පාර්ලිමේන්තුවේ සංයුතිය සමස්තයක් ලෙස වෙනස් නොවන බැවින් පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂ එකඟ කර ගැනීමට මා හට හැකි වනු ඇත. තවද, මෙහිදී අපේක්ෂකයන්ගේ මැතිවරණ ව්‍යාපාර එක් මැතිවරණ කොට්ඨාශයකට පමණක්

---

**'මැතිවරණවල මනාප ක්‍රමය අහෝසි කරමි. සෑම මැතිවරණ කොට්ඨාසයකටම අනිවාර්යයයෙන්ම එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ සිටින බවට සහතික වෙමි.**

---

සීමා වන බැවින් නාස්තිය හා ගැටුම් අවම කිරීමට හැකි වේ.

## ■ යහපාලනය අධීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණයක්

2010 වසරින් පසු වකවානුවේ අපගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයට එල්ල වූ ප්‍රධානතම චෝදනාවක් වන්නේ අල්ලස් හා දූෂණය පිළිබඳ ගැටළුවයි. රටේ යහපාලනය පිළිබඳ වාතාවරණය පිරිහීමට බලපෑ ප්‍රධානතම හේතුව වන්නේ 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයයි. මවිසින් ජනාධිපති වී පළමු දින සියය ඇතුළත දී සිදු කරන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රධාන අංගයක් වන්නේ මෙම 18 වන ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමයි.

**ඒ වෙනුවට,**

- නව ව්‍යවස්ථා සංශෝධනයක් මඟින් අධිකරණ, පොලීසිය, මැතිවරණ, විගණන හා නීතිපති වැනි ආයතනවල අපක්ෂපාතිත්වය ආරක්ෂා කිරීම පිණිස ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කරමි.

- අල්ලස් හා දූෂණ පිළිබඳ කොමිසම තවදුරටත් ශක්තිමත් සහ ක්‍රියාශීලී කරමින් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගත් ස්වාධීන ආයතනයක් බවට පත් කරන්නෙමි. ශ්‍රී ලංකාව ද අත්සන් කර ඇති එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තියට අනුකූල වන සේ දූෂණ වලක්වාලන ව්‍යුහයන් ශක්තිමත් කිරීමට කටයුතු කරනු ඇත.

- රාජ්‍ය සේවය, ආණ්ඩුවේ ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වන බව හා අපක්ෂපාතීව ක්‍රියා කරන බව තහවුරු කිරීම සඳහා රාජ්‍ය සේවය හා පොලීසිය සඳහා නිර්දේශපාලනික කුසලතා පදනමක් හඳුන්වා දෙන්නෙමි.

- අධිකරණයේ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා අධිකරණ කොමිසම ස්ථාපිත කරන්නෙමි. එමඟින් විනිසුරන් පත්කිරීම හා උසස් කිරීම ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාව මත සිදුකරනු ඇත.

- යුක්තිය පසඳලීමේ ක්‍රමවේදය ශක්තිමත් කරනු වස් නඩු කටයුතු ප්‍රමාදවීම වැලැක්වීම සඳහා ගතයුතු කාර්ය පටිපාටික සංශෝධන හා අවශ්‍ය මානව හා භෞතික සම්පත් නිසි පරිදි ලබාදීමට කටයුතු කරමි.

- සියලු තරාතිරම්වල පුද්ගලයන්ගේ නොමනා ක්‍රියා නිසා රට තුළ ඇදහිය නොහැකි පරිමාණයෙන් වර්ධනය වී ඇති දරුවන් හා කාන්තාවන් ගොදුරු වන අපචාර වලක්වාලීමට උපරිම ක්‍රියාමාර්ග ගන්නා අතර ඊට අදාල නඩු විභාග ඉතා කෙටි කලකදී අවසන් කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දෙන්නෙමි. එමඟින් ළමා හා කාන්තා දූෂණ සහමුලින්ම නවතාලීමට කටයුතු කරන්නෙමි.

- මැතිවරණ අපේක්ෂකයින් විසින් රාජ්‍ය බලය, ධන බලය, මාධ්‍ය බලය අයුතු ලෙස යොදා ගැනීම සහමුලින් පාලනය කිරීම සඳහා මැතිවරණ කොමිසම ස්ථාපිත කරන්නෙමි.

**18 වන ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කර ඒ වෙනුවට නව ව්‍යවස්ථා සංශෝධනයක් මගින් අධිකරණ, පොලීසිය, මැතිවරණ, විගණන හා නීතිපති වැනි ආයතනවල අපක්ෂපාතිත්වය ආරක්ෂා කිරීම පිණිස ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කරමි.**

---

- තාක්ෂණික, කළමනාකරණ හා මූල්‍ය දූෂණ සෙවිය හැකි සහ ඒවාට දඬුවම් ලබාදිය හැකි, දේශපාලන ඇඟිලි ගැසීම් නැති බලගතු දූෂණ මර්ධන කොමිසමක් ව්‍යාවස්ථාවෙන් ඇති කරමි. එමගින් රට පුරා පිළිකාවක් ලෙස පැතිර ඇති දූෂණය දුරු කර පිරිසිදු පාලනයක් ඇති කරමි.

- සංවර්ධන කටයුතුවල සියලු තොරතුරු ජනතාවට දැනගත හැකි තොරතුරු දැනගැනීමේ පනතක් ද ගෙන එමි.

- පුරවැසි සහභාගිත්වය වර්ධනය කරමින් ආර්ථික, සාමාජීය, යහපාලන හා මානව හිමිකම් ක්ෂෙත්‍ර වල පුරවැසි සංවිධාන වල ක්‍රියාකාරකම් වලට ඇති බාධක ඉවත් කරන්නෙමි. දැනටමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිගෙන ඇති මානව හිමිකම් ආරක්ෂා කරගනිමින් පුරවැසි අයිතිවාසිකම් තවදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගැනේ.

**මෛත්‍රී**
**පාලනයක්...**
ස්ථාවර රටක්

# 02.

# රට නංවන ආර්ථිකයක්

දියුණු රටවලින් ඇරඹී මුළු මහත් ලෝකය පුරා මේ වනවිට පැතිරී යන ආර්ථික අර්බුදය, ලොව මුහුණ දී ඇති සමාජ, ආර්ථික, පාරිසරික හා සංස්කෘතික අර්බුදයේ එක් පැතිකඩකි. එය කෙටි කාලීන නොව දිගුකාලීන අර්බුදයකි. මෙම අර්බුදයන් හටගෙන ඇත්තේ මෛත්‍රිය වෙනුවට වෛරයත් මැදුම් පිළිවෙත වෙනුවට කාමසුඛල්ලිකානු යෝගයත් සීමිත ලෝකයක අසීමිත වර්ධනයක් ලබාගැනීමට වෑයම් කිරීමත් සොබාදහම සමඟ සහජීවනය වෙනුවට අධිපතිත්වය දැරීමට වෑයම් කිරීමත් යන වැරදි පිළිවෙත් නිසාය. අවාසනාවකට මෙන් අපේ රටේ ආර්ථිකය හසුරවන කිහිපදෙනා වෑයම් කරන්නේ ද මේ අගතිගාමී ගමන් මඟ ඔස්සේ වේගයෙන් පෙරට ගමන් කිරීමටයි.

ඒ අනුව මෑත කාලයේ දී අප රටේ දියත් කරන ලද ආශ්චර්යයන් ඉලක්ක කර ගත් සුළු, මධ්‍යම හා මහා පරිමාණ ව්‍යාපෘති සියල්ලම රට බරපතල ආර්ථික ව්‍යසනයක් දක්වා කැඳවාගෙන ගොස් ඇත. සංවර්ධනයේ ප්‍රතිලාභ ලෙස අද රටේ ජනතාවට පෙනෙන්නට ඇත්තේ රට ණය උගුලක හිර කරවා ලබාගත් මුළු මුදලින් දහයෙන් පංගුවකටත් අඩු ප්‍රමාණයක ප්‍රතිඵලයයි. එනම්, පසුගිය වසර දහය තුළ සිදු වූ සංවර්ධනය මෙන් දස ගුණයක සංවර්ධනයක් ගත් ණය ප්‍රමාණයට අනුව රට තුළ සිදු විය යුතුව තිබිණි. සිදුව ඇති සොච්චම් සංවර්ධනයත්

සිදුවූයේ ණය ආපසු ගෙවීමට හැකිවන ආකාරයේ ව්‍යාපෘතිවලින් නොවේ. එසේ වූයේ රටේ අවශ්‍යතාව අනුව නොව කිහිපදෙනෙකුගේ උවමනාව අනුව සංවර්ධනයේ ප්‍රමුඛතා සැකසී තිබූ නිසාය.

---

**රටේ සිදු වූ මෙගා දූෂණය නවතාලීම මඟින් පමණක් පසුගිය වසර හය තිස්සේ සිදු වූ සංවර්ධනය මෙන් දස ගුණයක සංවර්ධනයක් රටට ලබාදීමට කටයුතු කරන්නෙමි.'**

---

**එබැවින්,**

- රටේ සිදුවූ මෙගා දූෂණය හා නාස්තිය නවතාලීම මඟින් පමණක් පසුගිය වසර හය තිස්සේ සිදු වූ සංවර්ධනය මෙන් දස ගුණයක ප්‍රමාණ සංවර්ධනයක් රටට ලබාදීමටත් ජනතාවට සහන ලබාදීමටත් කටයුතු කරන්නෙමි.

- ඔබවෙන් සිටගත් සංවර්ධනයේ ප්‍රමුඛතා දෙපයින් සිටවීමට මම කටයුතු කරමි. නාස්තිකාර වැඩ සියල්ල අත්හිටවා රටේ ස්වාභාවික හා මානව සම්පත් මත පදනම් වූ සැබෑ තිරසාර ආර්ථික සංවර්ධනයක් ඉලක්ක කරගත් වැඩපිළිවෙලක් සකස් කිරීම උදෙසා, මුදලට නොව රටට සැබෑ ලෙසම ආදරය කරන විද්වතුන් ඇතුළත් ජාතික ආර්ථික සැලසුම් මණ්ඩලයක් ස්ථාපිත කරන්නෙමි. එම මණ්ඩලයේ නිර්දේශ මත ධන කුවේරයන්ගේ නොව දුක් විඳින දුගී දුප්පත් ජනතාවගේ ජීවන තත්වය සැබෑ ලෙසම නංවාලන වැඩපිළිවෙලක් ඉදිරි වසර හය තුළ දී මේ මහපොළවේ ක්‍රියාවට නංවන්නෙමි.

- රාජ්‍ය ණය පිළිබඳ සැබෑ තත්ත්වය රටට හෙළිදරව් කරන්නෙමි. එමඟින් රාජ්‍ය ණය ගැනීම් හා කළමනාකරණය පිළිබඳ සිදු වී ඇති අක්‍රමිකතා නිවැරදි කෙරෙනු ඇත. එමෙන්ම රාජ්‍ය ණය බර සැහැල්ලු කිරීම සඳහා කඩිනම් පියවර ගැනේ.

- ශ්‍රී ලංකාව රාජ්‍ය ණය බර වැඩි, ණය ආපසු ගෙවීම හා රාජ්‍ය ආදායම අතර භයානක අනුපාතයක් ඇති රටකි. රාජ්‍ය දේපොළ නොවිකිණීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අගය කරන අතරම ශ්‍රී ලංකාවේ ආර්ථික ආරක්ෂාවට තර්ජනයක් වන ලෙස විදෙස් රාජ්‍යයන් හෝ සමාගම් විසින්, උපායමාර්ගික ස්ථාන අත්පත් කර ගැනීම ද වලක්වමි. ආයෝජන විවිධාංගීකරණය හා එක් රටක ආයෝජන මත සහමුලින් රැඳී නොසිටීම මඟින් හා ප්‍රති ආයෝජනයන් මඟින් ද ජාත්‍යන්තර ප්‍රහාර වැළැක්වීමට ශ්‍රී ලංකාවේ ආර්ථිකය සූදානම් කරන්නෙමි.

- මෑත කාලයේ සිදු වූ මෙගා ව්‍යාපෘති සියල්ල නැවත ඇගැයීමකට ලක් කරන්නෙමි. එහිදී සිදු වූ තාක්ෂණික වංචාවන්වලට වගකිවයුත්තන්ට තරාතිරම නොබලා දඬුවම් ලබා දෙන්නෙමි. රට පුරා සිදු වන ලොකු-කුඩා සංවර්ධන ක්‍රියාවන් ද, ආයතනවල මිල දී ගැනීම් හා වෙනත් ගනුදෙනු ආදිය

ද අර්ථසාධක අරමුදල් වංචාකාරී ලෙස ආයෝජනය කිරීම ද පිළිබඳ අයථා ගනුදෙනු සෙවීමේ විශේෂ වැඩපිළිවෙලක් සම්පාදනය කෙරේ. සියල්ලන්ට එයට පැමිණිලි ඉදිරිපත් කළ හැකි අතර, ඒවා විභාග කර සුදුසු පරිදි දඬුවම් දීම සඳහා අධිකරණයකට යොමු කරනු ඇත.

- ජීවන බරින් පීඩා විදින ජනතාව ඉන් ගොඩ ගැනීම සඳහා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය 10 ක මිල ගණන් පහත හෙළීම සඳහා රේගු බදු ලිහිල් කරන්නෙමි. එමඟින් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිළ ක්ෂණිකව පහත වැටෙනු ඇත.

- සමාජයේ වඩාත්ම දුෂ්කරව ජීවත්වන ජනතාව සඳහා වන මාසික සමෘද්ධි දීමනාව දැනට ලැබෙන ප්‍රමාණය මෙන් උපරිම වශයෙන් දෙගුණයකින් වැඩි කර ඔවුනගේ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය විධිමත් අංග සම්පූර්ණ වැඩපිළිවෙලක් ජන සවිය වැඩසටහනට අනුරූප වන ලෙස දියත් කරන්නෙමි.

- ණය බරින් බැට කන ජනතාවගේ ක්ෂණික සහනය සඳහා රජයේ සේවකයන්ගේ වැටුප රු.10,000/- කින් වැඩි කරමි. එම වැටුප් වර්ධනයේ පළමු කොටස ලෙස රු. 5,000/- 2015 පෙබරවාරි මස සිට ගෙවීමට කටයුතු කරමි.

- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ද නිසි ගෞරවය ලබා දෙමි. විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කරන තෙක් ඔවුන්ට රුපියල් 3,500/-ක මාසික අන්තර් දීමනාවක් ලබාදෙනු ලැබේ. තවද බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ සේවකයන් හට පිළිගත හැකි විශ්‍රාම වැටුපක් ලබාදීමට කටයුතු කරන්නෙමි. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතුවල පළමු ලක්ෂ 10 සඳහා ගෙවනු ලබන පොලිය 15% ක් දක්වා ඉහළ දැමේ. ආර්ථික අගහිඟකම් වලින් පෙළෙන දුප්පත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රජය මඟින් ලබා දෙන මාසික දීමනාව රුපියල් 1,500 කින් වැඩි කෙරේ.

---

**මාසික සමෘද්ධි දීමනාව උපරිම වශයෙන් දෙගුණයකින්ද රජයේ සේවකයන්ගේ වැටුප රු.10,000/- කින් ද වැඩි කරමි. විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කරන තෙක් රුපියල් 3,500/- ක මාසික අන්තර් දීමනාවක් ලැබේ.**

---

- හිසට සෙවනක් නොමැතිව ජීවත් වන ලක්ෂ ගණනක් වූ ජනතාවට නිවාස ලබාදීමේ කඩිනම් වැඩසටහනක් වහාම ආරම්භ කරන්නෙමි.

- යුද්ධයේ දී වැන්දඹු වූ සියලු ජන කොටස්වල කාන්තාවන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට විශේෂ රැකවරණ ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි.

# 03.
# සදාචාර සම්පන්න සමාජයක්

## • මත් ද්‍රව්‍ය, මත්පැන් හා සිගරට් උවදුරෙන් රට මුදවා ගැනීම

අපේ රටේ ජනතාව, විශේෂයෙන් පුරුෂ පක්ෂය, ජාති ආගම් භේදයකින් තොරව මත් ද්‍රව්‍ය, මත්පැන් හා සිගරට්වලට භයානක ලෙස ගොදුරු වී සිටිති. දුගීකම දුරලීම සඳහා ආණ්ඩුව විසින් වියදම් කරනු ලබන සමෘද්ධිය, දිවි නැගුම වැනි සමාජ සහනාධාර ව්‍යාපෘතිවලට වඩා දහ ගුණයකටත් වැඩි මුදලක් අපේ ජනතාව මත්පැන්, මත්ද්‍රව්‍ය හා සිගරට් සඳහා වියදම් කරති. රට පුරා මහා පරිමාණයෙන් මත්කුඩු උවදුර පැතිර යද්දී, ඒවාට සම්බන්ධ බවට පැහැදිලි චෝදනා තිබෙන දේශපාලකයන් ආරක්ෂා කිරීමේ විෂම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක විය. තමන්ගේ ගජ මිතුරන්ට හෙරොයින් පහසුවෙන් බෙදා හැරීම පිණිස ඔවුන්ගේ තරඟකරුවන් පමණක් මර්ධනය කරනු ලැබීය. මහින්ද චින්තනයේ 'මතට තිත' ප්‍රතිපත්තිය පසෙකලා එතනෝල්, මෙතනෝල් ආදී ව්‍යාපාර රජ කරන්නට විය. මතට ගොදුරු වී අපේ ජනයා අපාදුක් විඳිද්දී එතනෝල් කල්ලි, මත්ද්‍රව්‍ය කල්ලි දේශපාලනයට කැඳවා ගනු ලැබී ය. මෙම මත්ද්‍රව්‍ය හා මත්පැන් ව්‍යාපාරිකයන්ට සන්ධාන ආණ්ඩුවේ කැබිනට් ඇමති ධුර හා වෙනත් ඇමති ධුර ද ලබා දෙනු ලැබිණි. අද කිසිදු ඵල ප්‍රයෝජනයක් නැති දේශපාලන ප්‍රචාරක ව්‍යාපාර රට පුරාම ක්‍රියාත්මක කරන්නේ මේ කුඩුවලින් මත්පැන්වලින් හම්බ කරගත් ප්‍රකෝටි ගණන් වූ මුදලෙන් සොච්චමක් වැය කරමිනි.

වසරකට පිළිකා රෝගයෙන් අපේ ජනතාව 15,000 දෙනෙක් මියයති. එයින් ද මුඛ හා පෙනහළු පිළිකා ප්‍රමුඛය. එයට ප්‍රධාන හේතුවක් වන්නේ අධික දුම් පානයයි. එමගින් ඔවුහු තව තවත් දුගීබවට පත් වෙති. පවුල් අවුල් වේ. දරුවන් නුගතුන් බවට පත්වේ. එතැන ගොඩනැගෙන්නේ දුගීකමේ, කාලකන්නිකමේ, රෝගීකමේ වියරු විෂම චක්‍රයකි. මෙම ඛේදජනක තත්වයෙන් රට මුදවා ගැනීම සඳහා වූ ඓතිහාසික අවස්ථාව උදාවූයේ යුද ජයග්‍රහයෙන් පසු 2010 වසරේදීය.

## මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ට සුවිශේෂී පුනරුත්ථාපන මධ්‍යස්ථාන. දුම්වැටි ඇසුරුම්වල රූපමය අවවාද 80% දක්වා ඉහළට.

එහෙත්, අවාසනාවකට අපට ඒ අනර්ඝ කර්තව්‍යය සිදු කිරීමට නොහැකි විය. මහින්ද රාජපක්ෂ මහතාගේ අදූරදර්ශී අත්තනෝමතික ක්‍රියාකලාපය නිසා මුළු මහත් කැබිනට් මණ්ඩලයත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයනුත් අසරණ වූහ.

මහා සංඝරත්නයේ මූලිකත්වයෙන් මත්ද්‍රව්‍ය හා සිගරට් පාලනය කිරීම සඳහා පනතක් ගෙනෙනු ලදුව මත්ද්‍රව්‍ය නියාමන අධිකාරියක් පිහිටවනු ලැබූ නමුත් එය ක්‍රියාත්මක කිරීමට රට තුළ බලපැවැත්වූ ආඥාදායකත්වය ඉඩ තැබුවේ නැත. මාගේ මැදිහත් වීමෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද සිගරට් පැකට්ටුවල 80% රූපමය අවවාද දැමීමේ රෙගුලාසිය වසර දෙකක් පමා කරනු ලැබීය. පිළිකා රෝහල්වල මිනිසුන් දහදුක් විඳ මිය යද්දී බටහිර සිගරට් සමාගම්වල පඳයට ජාතික පාවා දෙනු ලැබීම හේතුවෙන් අධිකරණයේ බංකු මත හිඳ කාලය මරමින් කඳුළු පුරවාගත් දෑසින් බලා සිටීමට මා හට සිදුවිය. එතැන් සිට වාර්ෂිකව සෞඛ්‍ය අමාත්‍යාංශයට හිමි විය යුතු වාර්ෂික මුදල් ප්‍රතිපාදන මුදල් අමාත්‍යාංශයත් මහා භාණ්ඩාගාරයත් සංවිධානාත්මක ලෙස කප්පාදු කරන ලදී. සමාජය විනසන මෙම ව්‍යාපාරවලට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු යුගය මා ජනාධිපති බවට පත්වීමත් සමඟ සපුරා අවසන් වනු ඇත.

**ඒ අනුව,**

- මත්කුඩු ජාවාරම්කරුවන් මැඩලීම සඳහා ජාතික ඔත්තු සේවය, විශේෂ කාර්ය බලකාය, ශ්‍රී ලංකා රේගුව, අන්තරාදායක ඖෂධ පාලන අධිකාරිය ආදිය ඒකාබද්ධ කර විශේෂ බලකායක් ස්ථාපිත කරන්නෙමි.
- සියලු මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ නම් ගම් හෙළිදරව් කරන්නෙමි.
- රේගු බදු නොගෙවා සිදුකරන එතනෝල් ජාවාරම මර්දනය කරනු ලබන අතර, තරාතිරම නොබලා දඬුවම් ලබාදීමට වැඩපිළිවෙලක් සකසන්නෙමි.
- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් ගලවා ගැනීම සඳහා සුවිශේෂී පුනරුත්තාපන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට කටයුතු කරන්නෙමි.
- දුම්වැටි ඇසුරුම්වල රූපමය අවවාද 80% දක්වා වැඩිකිරීමට කටයුතු කරන්නෙමි.

- තුන් නිකායේම මහානායක හිමිවරුන්ගේ විරෝධතා හා පාර්ලිමේන්තුව හා අමාත්‍ය මණ්ඩලයේ ඇතැම් තීරණවලට පටහැනිව උපායමාර්ගික පනත යටතේ අප්‍රමාණ බදු සහන දෙමින් ලබාදෙන "වෝටර් ෆ්‍රන්ට්" හා "ලේක් ලෙෂර්" කැසිනෝ බලපත්‍ර දෙකට ඉඩ නොදෙමි.

- උපායමාර්ගික පනත සම්මත වූ දා සිට එකී බදු සහන ලබා දී ඇති ව්‍යාපෘති අධ්‍යයනය කර අවිධිමත්, වංචාකාරී ව්‍යාපෘති උපායමාර්ගික තත්වයෙන් ඉවත් කරමි.

## ■ සංස්කෘතික හා ආගමික නිදහස හා සංහිඳියාව

මෙරට සියලු ජන කොටස්වලට ශ්‍රී ලාංකික අනන්‍යතාව පිළිගනිමින් තම සංස්කෘතිය, භාෂාව හා ආගම වර්ධනය කිරීමට හා සුරක්ෂිත කිරීමට ඇති අයිතිය තහවුරු කරමි. සෑම ජන කොටසකටම ආණ්ඩුවේ ආයතනයන්හි නිසි නියෝජනත්වය ලැබෙන බවට සහතික වෙමි.

අන්තවාදී ආගමික කල්ලිවල ක්‍රියාකාරිත්වය නිසා රට තුළ ආගමික නොසන්සුන්කම් වර්ධනය වෙමින් පවතී. මෙම තත්වය තුළ අන්තවාදී කණ්ඩායම් අන්‍යොන්‍යවශයෙන් පෝෂණය වෙමින් සිය වැඩකටයුතු ව්‍යාප්ත කරමින් සිටිති.

**මෙම තත්වය පාලනය කරගැනීම සඳහා,**

- සියලු ආගම්වල අන්තවාදී පිරිස්වලට ඉඩකඩ නොලැබෙන පරිදි ආගමික සහජීවනය වෙනුවෙන් ක්‍රියාකරන හා අන්තවාදයට එරෙහිව සෘජුව ක්‍රියාකරන ආගමික නායකයින්ගෙන් සමන්විත වන ප්‍රාදේශීය හා ජාතික මණ්ඩල ස්ථාපිත කරන්නෙමි. එම මණ්ඩලවලට ආගමික ස්ථාන ආශ්‍රිත ගැටළු පිළිබඳ විමර්ශනය කර අවසන් නිගමන ලබාදීම සඳහා බලය පැවරේ. ප්‍රාදේශීය මණ්ඩලවල දී නිරාකරණය නොවන ගැටළු පිළිබඳ අවසන් තීරණය ජාතික මණ්ඩලය වෙත පැවරේ.

- නීති විරෝධී ලෙස තම නිවාස හා ඉඩම් වලින් විවිධ හේතු මත ඉවත් කළා වූ සියලු පුරවැසියන්ට සහන සලසන්නෙමි. කොළඹ නගරයේ නිවාස හා ඉඩම් අහිමි කරන ලද ජනතාවගේ එම දේපොළ යලි තක්සේරු කර ඒවාහි වටිනාකම දැනට ගෙවන නිවාස ණය මුදලින් අඩු කරන්නෙමි. වතුකරයේ ජනතාව දැනට ජීවත් වන දුෂ්කර 'ලයින් කාමර' ජීවිතයෙන් මුදවා ගෙන ඔවුන්ට ඉඩම් අයිතිය ද සමග සැබෑ නිවසක හිමිකාරත්වය ලබාදෙන්නෙමි.

තවද ආගමික නිදහසට බාධා වන අයුරින් රාජ්‍ය නායකයාගේ පවුලේ මෙහෙයවීමෙන් මෑත කාලයේ සිදු කළ හා සිදුවූ අත්තනෝමතික ක්‍රියා, රටටත් ආගමටත් බරපතල අවමානයක් ගෙන දෙනු ලැබීය. එම තත්වය වහාම වෙනස් කිරීම උදෙසා කඩිනම් පියවර ගන්නෙමි.

**ඒ අනුව**

- සියලු ආගම්වල ජනතාවට තමන්ගේ ආගමික ඇදහිලි සඳහා ඇති නිදහස සහතික කරන්නෙමි.

- ශ්‍රී දළදා මාළිගාව ඇතුළු පූජනීය ස්ථාන ආශ්‍රිතව පවත්වාගෙන යන සුරාසැල් එම

ස්ථානවලින් වහාම ඉවත් කරන අතර එම පූජාභූමි අවට කාර් රේස් පැවැත්වීම වහාම තහනම් කරන්නෙමි.

- යෝජිත බෞද්ධ විහාර හා දේවාලගම් පනතේ සංශෝධන මහ නාහිමිපාණන් වහන්සේලාගේ අවවාද අනුශාසනා, මඟ පෙන්වීම් හා අනුමැතිය මත සිදු කරන්නෙමි.
- සාම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම සහ දහම් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා වැඩසටහනක් ආරම්භ කරන්නෙමි. පිරිවෙන් අධ්‍යාපනය ජාත්‍යන්තර මට්ටමට ඉහළ නැංවීම උදෙසා ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ඇති කිරීමට අවශ්‍ය පසුබිම සකස් කරන්නෙමි.
- සත්ත්ව හිංසනය වැලැක්වීම සඳහා නීති වහාම සම්මත කරන්නෙමි.

## ■ කලා සහ සංස්කෘතික ප්‍රවර්ධනය

රට භෞතික හා තාක්ෂණික වශයෙන් සංවර්ධනය වන විට කලා හා සංස්කෘතික සංවර්ධනයක් සිදුවීම ද අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා පෙරමුණ ගැනීමට සිටින කලාකරුවන් මේ වන විට අසරණභාවය පත්වී මුදලාලිලාගේ හා දැවැන්ත වාණිජ ව්‍යාපාරවල අභිමතාර්ථයන් ඉටු කරලමින් ජනතාව රවටන නානාවිධ දැන්වීම් ප්‍රචාරක ව්‍යාපාරවල මෙහෙකරුවන් බවට පත් වී සිය ප්‍රතිභාව සමාජ අගතිය සඳහා යොදවා ඇත. එබැවින් කලාකරුවන් මෙම තත්ත්වයෙන් මුදවාගෙන ජනතාවට සැබෑ මෙහෙයක් ඉටුකළ හැකි වන වාතාවරණයක් ගොඩනැංවීමට මම කටයුතු කරන්නෙමි. එමඟින් ගැටුම්කාරී සමාජ වාතාවරණයෙන් සමාජය මුදවාගැනීම උදෙසා කලාකරුවන්ගේ උපරිම දායකත්වය ලබාග න්නෙමි.

### ඒ සඳහා

- පරිහානියට පත්වෙමින් තිබෙන ජාතික සංස්කෘතික වටිනාකම් හා යහපත් කලා රසවින්දනය යළි ස්ථාපිත කිරීම හා සාරධර්ම පිරි සමාජයක් බිහි කිරීමේ අරමුණෙන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සියලු ආයතනවලට මාර්ගෝපදේශනය ලබාදීමට බලය ඇති ස්වාධීන විද්වතුන්ගෙන් සැදුම් ලත් යාන්ත්‍රනයක් ස්ථාපිත කරන්නෙමි.
- සියලු කලාකරුවන්ගේ ස්වාධීනත්වයට ගරුකරමින් ඔවුනගේ කලා හා නිර්මාණ හැකියාව ඔප නැංවෙන පරිදි රාජ්‍ය හා පුද්ගලික අංශයේ දායකත්වය තහවුරු කරමින් භෞතික හා මූල්‍ය සම්පත් ලබා දෙන්නෙමි.
- සකලවිධ සෞන්දර්ය දහරාවන්හි රාජ්‍ය පිලිගැනීම හා ඇගයීම තහවුරු කර කලාකරුවන්ගේ බුද්ධිමය දේපල අයිතිය තහවුරු කිරීමට පියවර ගන්නෙමි.
- කලා ක්ෂේත්‍රය සඳහා රාජ්‍ය ප්‍රතිපත්තියක් සම්පාදන කර මුළු මහත් සමාජය තුළ විවිධ ආයතන හරහා කලා රසවින්දන ශක්තීන් ඔප නැංවීමට අවශ්‍ය පසුබිම සකස් කරන්නෙමි.

# 04.

# සුරක්ෂිත ආහාර හා තිරසාර ගොවිතැන

## ආහාර හා ගොවිතැන

අද වන විට රට සහලින් ස්වයංපෝෂිත වුව ද අපගේ ගොවිතැන සහමුලින් පරායත්ත වූවකි. තෙල් සහ පොහොර අධික ප්‍රමාණයක් යෙදීමට සිදුව ඇති අතර ගොවිතැන සහමුලින්ම විදේශීය සමාගම් මත යැපීමට සිදුවී ඇතිවා පමණක් නොව ඒ තුළින් බරපතළ ගැටළු රාශියක් ද ජනිත කර ඇත. රටෙහි මුදල් පිටරට ඇදී යනවා පමණක් නොව වාතය, ජලය සහ පස දූෂණය වීම නිසා මිනිසුන් බරපතළ රෝගාබාධයන්ට ලක්ව ඇත. අපේ ගොවි ආර්ථිකයේ හදවත බඳු රජරට, විශේෂයෙන් මහවැලි කලාපවල ගොවි ගෙවිලියෝ දැනට දශක දෙකක සිට මාරාන්තික වකුගඩු රෝග යකින් පෙළෙති. ලෝක සෞඛ්‍ය සංවිධානය හා ශ්‍රී ලාංකික විද්වතුන් මෙයට හේතුව ලෙස සොයා ගනු ලැබුවේ ප්‍රමිතියකින් තොර පොහොර හා කෘෂි රසායන සමඟ ප්‍රදේශයේ කිවුල සහිත වතුර මිශ්‍රවීම බවයි.

මුදලට ගනු ලැබූ ඇතැම් විද්‍යාඥයන් යොදා ගනිමින්, කෘෂි රසායන සමාගම් විවිධ විසංවාදී මත ප්‍රකාශ කරද්දී, විෂ සහිත කෘෂි රසායන හා පොහොර පාලනය කිරීම සඳහා කැබිනට් අනු කමිටුව, නිලධාරී කමිටුව හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදේශකයනුත් නිර්දේශ කර තිබිණි. එහෙත් බලගතු අදෘෂ්‍යමාන හස්තයක් විසින් ඒවා ක්‍රියාත්මක වීම නතර කරනු ලැබී ය. රජරට අපේ ගොවි ජනතාව ලක්ෂ දෙකක් මිය යමින් සිටියදී,

ආණ්ඩුවේ නායකයින් එය වලකාලීම සඳහා කිසිදු පියවරක් නොගැනීම අපගේ හිත් කම්පා කරනු ලැබී ය. මිනිසුන්ගේ වකුගඩු මරනු ලබන ආසනික්, කැඩ්මියම් අන්තර්ගත කෘමිනාශක හා පොහොර බෙදා හරින්නට ඉඩහැර, වකුගඩු රෝගීන්ට බෙහෙත් ගැනීමට මුදල් ලබා දීමට පොරොන්දු වීම තරම් සාහසික වංචාවක් මා තවත් දැක නැත.

---

**වකුගඩු රෝගයට අදාල කෘෂි රසායන ගෙන්වීම තහනම්. ගොවි විශ්‍රාම වැටුප, ජීවන මට්ටමට ගැලපෙන පරිදි වැඩි කෙරේ. කෘෂි නිෂ්පාදන සඳහා සහතික මිළක්. ගොවිතැන් සඳහා සුළු ගොවීන්ට ඉඩම් හා වතුර.**

---

පිළිකා හා හෘද රෝග වැනි බරපතළ රෝග රට පුරා අතිශය සුලභ වීමට මෙම වස විස බලපා ඇති බව අනාවරණය වෙමින් පවතී. රජරට මාගේ ගොවි දරුවන් ගේ ජීවිත වෙනුවෙන් සටන් කරන්නට මා පෙළඹුනේ ඒ නිසා ය.

**එම නිසා,**

- වකුගඩු රෝගයට අදාළව හෙළිදරව් වූ කෘෂි රසායන ගෙන්වීම හා බෙදාහැරීම වහාම තහනම් කරන්නෙමි.

- ශ්‍රී ලංකාව ලෝකයේ ජෛව විවිධත්වයෙන් වැඩිම රටක් වන බැවින් අපගේ පරිසර පද්ධතියට උචිත ස්වභාවික ගොවිතැනට මඟ පාදන පාරම්පරික බීජ යළි ව්‍යාප්ත කිරීම හා දිරිදීම සඳහාත් කෘෂි තාක්ෂණික ආයතනවල දැනුම හා ශක්‍යතාව වැඩි දියුණු කිරීම සඳහාත් බීජ වල ඒකාධිකාරය සමාගම්වලට යට කිරීමට ඉඩ නොදීම සඳහාත් අවශ්‍ය රාජ්‍ය මැදිහත් වීම් හා ආයෝජනයන් වැඩි කරන්නෙමි.

- කාබනික පොහොර යොදාගැනීම හා රසායන නොවන කෘෂිකර්මය සඳහා ද පොහොර සහනාධාරයට අනුරූප වන පරිදි විශේෂ සහනාධාර ක්‍රමයක් ඇති කරන්නෙමි. දේශීය ශාඛ සාර භාවිතයෙන් පලිබෝධ පාලන දියර හෝ කුඩු නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දෙන්නෙමි. රසායනික පොහොර හා කෘෂි රසායන භාවිතය ක්‍රමානුකූලව ඉවත් කිරීම සඳහා කාල රාමුවක් සකස් කිරීම සඳහා කටයුතු යොදන්නෙමි.

- පරිසරයට හානිකර සංවර්ධන කටයුතු සඳහා අත්තනෝමතික ලෙස විදේශීය සමාගම් වලට ඉඩම් පැවරීම් අත්හිටුවා ගොවිතැන් කටයුතු සඳහා සුළු ගොවීන්ට ඉඩම් පරිහරණය කිරීමට අවස්ථාව ලබා දීම උදෙසා ජාතික ඉඩම් පිළිබඳ කොමිෂන් සභාවක් පත් කරන්නෙමි.

- මහා වැස්සෙන් වැටෙන ජලය සුරක්ෂිත කර ගැනීමට ද දේශගුණික විපර්යාසට මුහුණදීමට ද උපකාරී වන පරිදි ඇහිරී ඇති වාරි පද්ධති යළි ප්‍රතිසංස්කරණය කිරීම හා ගොඩ වී ඇති වැව්වල රොන් මඩ ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරන්නෙමි.

- හදිසි ජාතික අවශ්‍යතාවක් සේ සලකා, යාපන අර්ධද්වීපය ප්‍රමුඛ උතුරු පළාත සඳහා කෘෂි වාරි යෝජනා ක්‍රමයට පදනම දැමේ.

- කුඩා වැව් නඩත්තු කිරීම හා පාලනය එම පද්ධතිය පාලනය කරන ඒකකයේ වගකීමක් වන අතර රජය මඟින් එයට අවශ්‍ය පහසුකම් සැලසීම උදෙසා කටයුතු යොදන්නෙමි.
- සියලු ගොවි ණය 50% කින් කපා හැර ගෙවීමට ඇති ඉතිරි මුදල නැවත සමාලෝචනය කර ගෙවීමට සහන කාලයක් ලබාදීම.
- ගොවි විශ්‍රාම වැටුප, ජීවන මට්ටමට ගැලපෙන පරිදි වැඩි කරන්නෙමි.
- ගොවීන්ට වගා හානි රක්ෂණාවරණයක් රජයේ දායකත්වය ද ඇතුව ලබාදීම.
- කිරි ගොවීන්ට කිරි ලීටරයකට දැනට ගෙවන රුපියල් 60 ක සහතික මිල රුපියල් 10 කින් වැඩි කිරීම.
- කෘෂි නිෂ්පාදන සඳහා සහතික මිළක් ලබාදීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කරමි. ඊට අනුරූපව වී කිලෝවකට රුපියල් 50/- ක හා අර්තාපල් කිලෝවකට රුපියල් 80/- ක සහතික මිළක් නියම කරන්නෙමි.
- අස්වනු, ගොවියාගේ සිට පාරිභෝගිකයා වෙත පැමිණීමේ දී මතුවී ඇති විෂමතා දුරු කිරීම ගොවිතැන රැකගැනීමේ අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවින් වෙළඳපොල යාන්ත්‍රණය තවදුරටත් ශක්තිමත් කිරීමේ නව උපක්‍රම හඳුන්වා දෙන්නෙමි.
- රටට හා ගොවියාට ගැලපෙන කෘෂි අස්වනු සැකසීම, කෘෂි නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම, ගබඩා කිරීම හා ප්‍රවාහනය කිරීම පිළිබඳ නව ක්‍රම සංවර්ධනය හා ප්‍රචලිත කිරීම සඳහා වැඩපිළිවෙලක් යොදන්නෙමි.
- පරාධීන ගොවිතැනින් රට නිදහස් කරගැනීම සඳහා සොබා දහමට එකඟ, දේශීය සම්පත් මත පදනම් වූ තිරසර ගොවි ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමට අවශ්‍ය පසුබිම සකස් කරන්නෙමි.
- භූගත ජල සංචිත පවත්වාගෙන යාම සඳහා මධ්‍ය කඳුකරයේ ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීමට ප්‍රමුඛතාව ලබාදෙන්නෙමි.

## සොබාදහම රැකගැනීම

- වනාන්තර සහ වන සතුන් ආරක්ෂා කිරීම සඳහා වන විනාශය වැලැක්වීම හා සංවේදී පරිසර පද්ධති රැකගැනීම සඳහා තරාතිරම නොබලා සියලු පරිසර නීති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම සකස් කරන්නෙමි. එහිදී ග්‍රාමීය ප්‍රජාවගේ සම්ප්‍රදායික ජීවනෝපායට අගතියක් නොවන පරිදි වන සංරක්ෂණය පිළිබඳ පැහැදිලි ප්‍රතිපත්තියක් ඇති කොට ක්‍රියාත්මක කරනු ලැබේ.
- අප රටේ සංරක්ෂිත කලාප ලෙස නීතියෙන් නියම කර ඇති භූමි භාග ආරක්ෂා කර ගැනීම හා ඒවායේ මායිම්වල සුරක්ෂිතබව පිළිබඳව වගබලා ගැනීම සඳහා කටයුතු කරන්නෙමි.
- පාරිසරික වශයෙන් වටිනා හා දැනට විනාශවීමේ තර්ජනයට මුහුණ පා ඇති කලාප තවදුරටත් හඳුනාගෙන ඒවා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නෙමි.

- දැනට හානි සිදු වී ඇති හෝ විනාශවීමේ අවදානමට මුහුණ දී ඇති පාරිසරික වශයෙන් වටිනා කලාප ලොව පවතින නවීනතම විද්‍යාත්මක දැනුම උපයෝගී කර ගෙන නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමට පියවර ගන්නෙමි.

- සත්ව හා වෘක්ෂ ලතා ආඥා පනත නොබියව හා පක්ෂග්‍රාහී බවින් තොරව දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නෙමි.


- සංවර්ධන වැඩ සටහන්වල සංකල්පිත අවධියේදීම පාරිසරික බලපෑම් පිළිබඳ මූලික ඇගයීමක් අනිවාර්ය කිරීම.

- පාරිසරික වශයෙන් වටිනා හා දැනට විනාශවීමේ තර්ජනයට මුහුණ පා ඇති කලාප තවදුරටත් හඳුනාගෙන ඒවා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නෙමි.

- වන ජීවීන්ගෙන් ග්‍රාමීය ප්‍රජාවන්ට එල්ලවන තර්ජන වැළැක්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ඇති කොට ක්‍රියාත්මක කරන්නෙමි. මෙහිදී දැවෙන ප්‍රශ්නයක් බවට පත්ව ඇති වන අලි තර්ජන කළමනාකරණය සඳහා විශේෂ වැඩපිළිවෙලක් සැකසේ.

- නූතන පරිසර ගැටළුවලට මුහුණ දීමට හැකිවන ජාතික පරිසර ප්‍රතිපත්තියක් සම්පාදනය කරන්නෙමි. දේශගුණික විපර්යාසය නිසා සිදුවන නියඟය, ලැව්ගිනි, ගංවතුර, නාය යෑම්, සුළි සුළං, කුණාටු, සහ සමුද්‍ර ඛාදනය ආදී විවිධ වූ ආපදා සහ අනතුරු අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

- අනතුරු අවමකර ගැනීමේ ක්‍රමෝපායන් නිර්මාණය කොට ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නියෝජිත ආයතන සමඟ ඵලදායි සබඳතාවයක් පවත්වාගෙන යෑමට හැකිවන පරිදි සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන විධිමත් ලෙස ස්ථාපිත කරන්නෙමි.


මෛත්‍රී
පාලනයක්...
ස්ථාවර රටක්

# 05.

# සැමට සුව සෙත

**අවශ්‍ය සියලුම බෙහෙත් සහ පරීක්ෂා අඩුපාඩුවකින් තොරව ඊට ගැලපන රජයේ ආයතන වලින්. බටහිර, පෙරදිග හා දේශීය වෛද්‍ය ක්‍රම සම්බන්ධීකරණය කර ඒකාබද්ධ රජයේ සේවාවක්. දරුවෙකු ප්‍රසූත කරන සෑම මවකටම පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා ගැනීම සඳහා රුපියල් 20,000/- ක දීමනාවක්.**

නිදහසෙන් පසු සමයේ රටේ ක්‍රියාත්මක වූ රටට ගැලපෙන සෞඛ්‍ය ප්‍රතිපත්තිය නිසා සමාන ආර්ථික පසුබිමක් ඇති රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාව සෞඛ්‍යය සම්බන්ධයෙන් සාපේක්ෂව හොඳ මට්ටමක සිටී. එසේ නමුත් අද ජනතාවගේ රෝගී තත්ත්වය හා සෞඛ්‍යය ක්ෂේත්‍රයන්හි ඇති ගැටළු ගැන සලකා බලන විට එම තත්ත්වය ඉතා සීඝ්‍රයෙන් පිරිහෙමින් පවතින බව පෙනේ.

**එම නිසා,**

- අයවැයෙන් නිදහස් සෞඛ්‍ය සඳහා දැනට වෙන් කර ඇති 1.8% ක් පමණ වන මුදල 3% දක්වා ඉහළ දැමීම ආරම්භ කරන්නෙමි.

- රටේ සෑම පුරවැසියෙකුටම නිරෝගී දිවියකට පසුබිම සැකසීම සඳහා අංග සම්පූර්ණ ආහාර වේලක් ලබාගැනීමට අවශ්‍ය පසුබිම සකස් කරන්නෙමි. එහිදී මන්ද පෝෂණය හා අර්ධ මන්ද පෝෂණය දුරු කිරීම සඳහා ආහාර ලැබීම සහතික කිරීමට අමතරව යහපත් ජීවන චර්යාවන්ගේ පැවැත්ම, නිසි ශාරීරික ව්‍යායාම, මනා මානසික ප්‍රතිකාර සහ යහපත් පරිසරය සහතික කිරීම ආදී අංග වෙත ද අවධානය යොමු කරවන්නෙමි.

- රෝග නිවාරණය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛ කාර්යය ලෙස මම සලකමි. එම නිසා රෝග ඇතිවීම අවම කරන පුළුල් හා විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන්නෙමි.

- සෞඛ්‍ය සේවය අනාගතය වෙනුවෙන් කරන ආයෝජනයක් වන බැවින් රජයේ ප්‍රාථමික වෛද්‍ය මධ්‍යස්ථානවල සිට ඉහළම රෝහල් දක්වා ප්‍රතිකාර සඳහා පැමිණෙන රෝගීන්ට රෝගයේ බරපතලකම අනුව අදාළ මධ්‍යස්ථානය වෙත යොමුකර අනිවාර්යයෙන්ම එම රෝගීන්ට නිසි සේවාවක් සැපයෙන බවට සහතික වන්නෙමි. එහිදී අවශ්‍ය සියලුම බෙහෙත් සහ පරීක්ෂා අඩුපාඩුවකින් තොරව ඊට ගැලපන රජයේ ආයතනයේ දී ලබාදීමට අවශ්‍ය පසුබිම සකස් කරන්නෙමි. එමෙන්ම රජයේ රෝහල්වල සැත්කම් සඳහා පොරොත්තු ලේඛනවල සිටින සියලුම රෝගීන්ගේ සැත්කම් නිම කිරීමේ කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන අතර රජයේ රෝහල්වල බාහිර ප්‍රතිකාර අංශය රාත්‍රී 10.00 දක්වා විවෘත කර තැබීමට පියවර ගන්නෙමි.

- බහුජාතික සමාගම්වල සියලු කුමන්ත්‍රණ පරාජය කර, අතුරුදහන් කළ රාජ්‍ය සබුද්ධික ඖෂධ පනත කඩිනමින් සම්මත කරන්නෙමි.

- ඩෙංගු මදුරු උවදුර තුරන් කිරීම සඳහා දැනට ලොව සොයාගෙන ඇති ඉහළම තාක්ෂණික ක්‍රම කඩිනමින් ලබා ගැනීමට පියවර ගන්නෙමි.

- දරුවෙකු ප්‍රසූත කරන සෑම මවකටම පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා ගැනීම සඳහා රුපියල් 20,000/- ක දීමනාවක් දරු උපතේදී ලබා දෙන්නෙමි.

- ආහාර, රූපලාවන්‍ය භාණ්ඩ හා සේවා, ඖෂධ ආදී සියලු පාරිභෝගික භාණ්ඩ නියාමනය සඳහා පාරිභෝගික සේවා අධිකාරිය, ආහාර උපදේශක කමිටුව, ඖෂධ නියාමන අධිකාරිය, ආදී සියලු භාණ්ඩ නියාමන ආයතන එක්කර තනි ශක්තිමත් බලයක් සහිත නියාමන ආයතනයක් පිහිටුවන්නෙමි.

- රෝග සුව කිරීම සඳහා පාරම්පරික දේශීය සිංහල වෙදකම, ආයුර්වේදය, සිද්ධ, හොමියෝපති, යුනානී වැනි විකල්ප වෛද්‍ය

ක්‍රම භාවිතා කිරීමේ විශේෂ වැඩපිළිවෙලක් දියත් කරන්නෙමි. එහිදී නව ලෝකයේ අභියෝගයන්ට මුහුණදීමට හැකි වන පරිදි ආයුර්වේදයේ නව පිබිදීමකට අවශ්‍ය නිසි වැඩපිළිවෙලක් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ මූලිකත්වයෙන් සම්පාදනය කරන්නෙමි.

- ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුළ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ කාර්යභාරය සම්බන්ධයෙන් වූ ජනාධිපති කාර්ය සාධක බලකායේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ජනාධිපතිවරයාට වගකියන මෙහෙයුම් කමිටුවක් පත් කරන්නෙමි.

- කාලීන අවශ්‍යතාවට ගැලපෙන පරිදි නව ආයුර්වේද පනතක් හා ආයුර්වේද ඖෂධ විලවුන් සහ උපකරණ නියාමයනය සම්බන්ධයෙන් පනතක් සම්මත කර ක්‍රියාත්මක කරන්නෙමි.

- ආයුර්වේදය හා දේශීය වෛද්‍ය ක්‍රමයට අදාළ සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රම වඩාත් ප්‍රායෝගිකව සමාජගත කිරීමට හැකිවනු පිණිස ආයුර්වේද ප්‍රජා වෛද්‍ය සෞඛ්‍ය සේවය නෛතිකව සවි බල ගැන්වීමට කටයුතු කෙරේ.

- සියලු බටහිර, පෙරදිග හා දේශීය වෛද්‍ය ක්‍රම මනා ලෙස සම්බන්ධීකරණය කර ඒකාබද්ධ සේවාවක් ජනතාවට සැපයීමට අවශ්‍ය පියවර ගන්නෙමි.

- ශ්‍රී ලංකාවට ආවේණික විවිධ දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් බිහිකිරීමට හැකි වන පරිදි දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයක් පිහිටුවීමට කටයුතු කරන්නෙමි.

- රෝගීන්ට දරාගත නොහැකි මට්ටමට ඖෂධ මිල ඉහළ ගොස් ඇති බැවින් ශ්‍රී ලංකාව තුළ දේශීය හා බටහිර ඖෂධ පහසු මිලට ලබාගැනීමට හා නිෂ්පාදනයට හැකි වන පරිදි ඖෂධ ද්‍රව්‍ය ආයතනයක් ඇති කිරීමට හා ඒවා සඳහා අය කරන බදු මුදල් ලිහිල් කිරීමට කටයුතු කෙරේ.

# 06.

# නව අභියෝග ජයගන්නා නිදහස් අධ්‍යාපනයක්

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය, ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය හා බලශක්ති පරිභෝජනයට සාපේක්ෂව බලද්දී දියුණු රටවල මට්ටමක පවතී. ඊට හේතු වී ඇත්තේ අපේ රටේ සංස්කෘතිය මඟින් කර ඇති බලපෑමයි. නිදහසින් පසු යුගයේ නිදහස් අධ්‍යාපනය තහවුරු කර පුළුල් කිරීම නිසා ජනතාව තුළ අධ්‍යාපනය සඳහා ඇති අභිලාෂය අති විශිෂ්ට වේ. සෑම දෙමාපියෙක්ම තම දරුවාට හොඳින් උගැන්වීමට ඇප කැප වී සිටී. අවාසනාවකට මෙන් ජනතාවගේ එම ප්‍රාර්ථනාවන් වියැකී යන අයුරින් නිදහස් අධ්‍යාපනය හැකිලෙමින් තිබේ. අධ්‍යාපනයේ භෞතික සම්පත් ඔස්සේ ප්‍රමාණාත්මක පක්ෂයේ වර්ධනයක් පෙන්නුම් කර තිබුණ ද ගුණාත්මක පක්ෂයේ කඩාවැටීමක් පෙන්නුම් කරයි. ගම්බද පාසැල්, පහසුකම් නොමැති නිසා වැසී යමින් පවතී. මෙය බරපතල තත්වයකි. එම තත්වය වෙනස් කිරීම උදෙසා විධිමත් වැඩපිළිවෙලක් දියත් කිරීමට මම කටයුතු කරන්නෙමි.

අධ්‍යාපනයේ විෂමතා වේගයෙන් උත්සන්න වීම නිසා මතු වී තිබෙන අවලස්සන තරඟය හේතුවෙන් යුක්තිය සමානාත්මතාවය පිළිබඳ හැඟීම අධ්‍යාපන පද්ධතියෙන්ම තුරන් වී තිබේ. අධ්‍යාපනයේ ප්‍රශ්නය ජාතික ප්‍රශ්නයක් වන තරමටම ඔඩු දුවා ඇත. ඒ අනුව රටට ගැලපෙන රැ

ඕකල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් ක්‍රියාත්මක කළ යුතු බවට මෙහි ලා යෝජනා කරමි.

**එහිදී,**

- දැනට සමස්ත අධ්‍යාපනයට වෙන් කෙරෙන දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.7% ක ප්‍රමාණයේ ප්‍රතිපාදනය 6% දක්වා වර්ධනය කිරීමට කටයුතු කරන්නෙමි.

---

**සමස්ත අධ්‍යාපනයට වෙන් කෙරෙන වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් 6% දක්වා වැඩි කෙරේ. සරසවි මහපොළ ශිෂ්‍යාධාරය රු. 5000ක් දක්වා වැඩි වේ. තාක්ෂණික අධ්‍යාපන ආයතනයන්ට පිවිසෙන තරුණ තරුණියන්ට ණය පහසුකම් ලැබේ.**

---

- පෙර පාසැල් අධ්‍යාපනයේ පටන් අධ්‍යාපනයේ නියාමනය කළ යුතු සියලුම අංශ සඳහා නියාමන ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරමි. ඒ අනුව 1 වසර සඳහා දරුවන් පාසැලට ඇතුළත් කිරීමේදීත් පහ වසර ශිෂ්‍යත්ව විභාග යෙන් පසු හය වසරට සිසුන් ඇතුළත් කිරීමේ දීත් දැනට ඇති ප්‍රමාදයන් සම්පූර්ණයෙන්ම නැති කරනු ලැබේ. පළමු වාරය ආරම්භ වන විටම සියලු දරුවන්ට පාසැල් ලබා දීම සහතික කරන්නෙමි.

- ප්‍රධාන පාසල් 55 ක් සඳහා රටේ විශාල ඉල්ලුමක් පවතින අතර ඇතැම් නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල පාසල් වැසී යමින් පවතින බැවින් ප්‍රාථමික අංශය සඳහා වඩාත්ම පුළුල් පාසැල් පද්ධතියක් ද එම පාසැල්වලින් පෝෂණය වන කණිෂ්ඨ ද්විතීක පාසැල් පද්ධතියක් ද උසස් පෙළ සඳහා ඉන් පෝෂණය වන ප්‍රධාන පාසැල් පද්ධතියක් ද සැකසේ. සියලු ප්‍රාථමික හා කණිෂ්ඨ පාසැල්වලට අවශ්‍ය පහසුකම් පූර්ණ වශයෙන් සැපයීමෙන් පසු ප්‍රධාන පාසැල්වලින් ක්‍රමානුකූලව ප්‍රාථමික හා කණිෂ්ඨ අංශ ඉවත් කෙරේ. මේ අනුව දැනට පවතින පහසුකම් සහිත පාසල්වලට ළමයින් ඇතුළත් කිරීමේ තරඟය සමනය වේ.

- බදුල්ල, නුවරඑළිය, මහනුවර, මාතලේ, කෑගල්ල යන දිස්ත්‍රික්කවල වතුකරයේ ජනතාවගේ දරුවන්ට දෙමළ මාධ්‍යයෙන් උසස් පෙළ විද්‍යා විෂයන් හැදෑරිය හැකි වන පරිදි පහසුකම් සහිත පාසල් ආරම්භ කරන්නෙමි.

- ජාත්‍යන්තර පාසල් සම්පූර්ණයෙන්ම රජයේ අධීක්ෂණයට ගැනීමට පියවර ගන්නෙමි. රටේ පොදු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට ජාත්‍යන්තර පාසල් ද ඇතුළත් කෙරේ. එහි පාඨමාලා සියල්ල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියකට අනුකූලව සිදුකළ යුතුවේ. සෞන්දර්ය අධ්‍යාපනය, සොබාදහමේ ධර්මතා, යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ මූලධර්ම, පුද්ගල හැසිරීම, සාමාන්‍ය පුද්ගල චර්යා ධර්ම ආදිය සෑම විෂය ධාරාවකටම ඇතුළත් කළ යුතුය.

- උසස් පෙළ සහ සාමාන්‍ය පෙළ කඩ ඉම් විභාගවලින් පසු තෘතීක අධ්‍යාපනය සඳහා

එම විභාගවල ප්‍රතිඵල භාවිතා කර සිසුන් යොමු කරන ක්‍රමවේදයක් සකස් කරන්නෙමි. එමඟින් රටට අවශ්‍ය තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය දැනට වඩා පුළුල් හා විධිමත් කොට පුළුල් විෂය ක්ෂේත්‍රයන්ට විවෘත කෙරේ. ශාස්ත්‍රීය දැනුම ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා නොමැති යෞවනයන් සඳහා සුදුසු විෂයක හා තරාතිරමක තාක්ෂණික අධ්‍යාපනය දිරි ගැන්විය යුතුය. දේශීය හා විදේශ රැකියා වෙළඳපොළ සඳහා පුහුණු තාක්ෂණික නිපුණතාවෙන් යුත් තරුණ තරුණියන් බිහි කළ හැකි තාක්ෂණික අධ්‍යාපන ආයතනයන්ට බාධාවකින් තොරව පිවිසිය හැකි ණය පහසුකම් විධි ක්‍රම හඳුන්වා දෙනු ලැබේ.

- නවෝත්පාදන ආර්ථිකයකට අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය සඳහා උසස් අධ්‍යාපන ක්ෂෙත්‍රය පූර්ණ ප්‍රතිසංවිධානයකට ලක් කිරීමට අවශ්‍ය පියවර ගන්නෙමි.

- සරසවි මහපොළ ශිෂ්‍යාධාරය රු. 5000 ක් දක්වා වැඩි කරන අතර විශ්ව විද්‍යාල සිසුන්ට අර්ධ කාලීන රැකියාවල නිරතවීමට නිදහස ලබා දෙන්නෙමි.

- ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය පුළුල් කර විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරගන්නා දරුවන් ප්‍රමාණය ක්‍රමානුකූලව දෙගුණයක් කරන්නෙමි. එහිදී සමාජ සාධාරණත්වය සුරැකෙන පරිදි විශ්ව විද්‍යාල ප්‍රවේශය නොලැබූ .ඊළඟට සිටින දක්ෂතම ශිෂ්‍ය කණ්ඩායම ජාතික විශ්ව විද්‍යාල තුළටම ශිෂ්‍ය ණය ක්‍රමයක් යටතේ ගාස්තු අයකර බඳවා ගැනීමට කටයුතු කෙරේ. කලා විෂය ධාරාව හැදෑරීම සඳහා එකතුවන විශාල පිරිස වෙනුවට කුඩා පිරිසක් ඉලක්ක කරනිමින් විශේෂඥයින් බිහිකර ගැනීම සඳහා කලා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය ප්‍රතිසංවිධානය කෙරේ. එසේම මූලික කලා හා සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ දැනුම විද්‍යා, වාණිජ, තාක්ෂණ ආදී සියලුම සිසුන් සඳහා ද හඳුන්වා දෙනු ලැබේ. තවද විශ්ව විද්‍යාලවලට ස්වාධීනත්වය ලබාදෙමින් උප කුලපතිවරු පත්කිරීම හා ඉවත් කිරීම ඒවායේ ප්‍රතිපත්ති අනුව පත්කළ සනාතන සභා වලට පවරනු ඇත.

- උසස් පෙළ විෂයන් 03 ක් සමත් සියලුම දෙනාට තමන්ගේ කැමැත්ත පරිදි උසස් ඩිප්ලෝමාවක් හෝ උපාධියක් දක්වා ඉගෙන ගැනීම සඳහා දිගු කාලීන සහනදායී ණය ක්‍රමයක් යටතේ අධ්‍යාපන ණය මුදලක් ලබාදෙනු ඇත.

- තරුණ සේවා සභාව ඇතුළු ආයතන, යෞවන සමාජ හා ව්‍යවස්ථාපිත සම්මේලන වැඩසටහන් පවුල්වාදයේ වහල් බැම්මෙන් මුදවා ගෙන යළි තරුණ තරුණියන් අතට පත් කරන්නෙමි. කුසලතා ඇති තරුණ තරුණියන්ට ගායන, වාදන, නර්තන, නිර්මාණ, ක්‍රීඩා කුසලතා පුහුණු කළ හැකි ආයතනයක් පිහිටු වන අතර එබඳු දක්ෂ තරුණ තරුණියන්ගේ රාජ්‍ය සංචිතයක් පවත්වාගෙන යනු ඇත.

- නව නිර්මාණ හා කුසලතා විෂයෙහි නව පිබිදීමක් ඇති කරලීමට සමත් වඩා නිදහස්වූත් විවෘතවූත් ආකාර පර්යේෂණ හා අභ්‍යාස ආයතනය ව්‍යුහයක් සංස්කෘති, තාක්ෂණ හා ක්‍රීඩා ක්ෂේත්‍රයන්ට හඳුන්වා දීමට කටයුතු කරන්නෙමි.

# 07.

# රට රැකෙන ජාත්‍යන්තර සබඳතා

**විදේශ සේවාවට අනුයුක්ත කර ඇති සියලු දේශපාලන පත්වීම් හා ඥාතීන්ගේ පත්වීම් අවලංගු කර සමස්ත විදේශ සේවාව වෘත්තීය නිලධාරීන් හා වෘත්තිය කුසලතා සුදුසුකම් සපුරා ඇති පිරිස් යොදාගෙන පූර්ණ ප්‍රතිසංවිධානයකට යොමු කරමි.**

2009 වසරේ යුද ජයග්‍රහණයෙන් පසු අපේ විදේශ ප්‍රතිපත්තිය අවුල් ජාලයක් වී ඇති බැව් මුළු මහත් ලෝකයම දන්නා කරුණකි. එක් අතකින් නිසි විදේශ ප්‍රතිපත්තියක් නැති අතර අනෙක් අතින් විදේශ සේවාවන්ට පත් කර ඇත්තේ රාජතාන්ත්‍රික ගුණාංග නොදන්නා සහචරයන් පිරිසකි. එම සහචරයෝ ගමේ ගොඩේ තමන් වැඩකටයුතු කරන ආකාරයෙන්ම අල්ලස් ලබාදී හා චණ්ඩිකම් පෙන්වා ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යාමට කටයුතු කරති. එහි අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ මුළු මහත් ලෝකය හමුවේ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය සම්පූර්ණයෙන්ම හෑල්ලු වී යාමයි. මෙම තත්වයෙන් ශ්‍රී ලංකාව මුදවා ගැනීම අත්‍යාවශ්‍ය හා ක්ෂණික අවශ්‍යතාවක් බවට පත්වී ඇත.

**ඒ සඳහා,**

- රටේ විදේශ ප්‍රතිපත්තිය ආණ්ඩුවේ ජාතික මතය නිරූපනය වන පරිදි සකස් කරන්නෙමි.

- දින සියයක් ඇතුළත විදේශ සේවාවට අනුයුක්ත කර ඇති සියලු දේශපාලන පත්වීම් හා ඥාතීන්ගේ පත්වීම් අවලංගු කර සමස්ත විදේශ සේවාව වෘත්තීය නිලධාරීන් හා වෘත්තීය කුසලතා සුදුසුකම් සපුරා ඇති පිරිස් යොදාගෙන පූර්ණ ප්‍රතිසංවිධානයකට යොමු කරමි. අපේ විදේශ සේවය රටට අවංක ජාතිකවාදී මත දරන, උගත්, වියත්, කාර්යශූර, හොඳම මිනිසුන්ගෙන් හා උපකරණවලින් සමන්විත විදේශ සේවයක් බවට පත් කරන්නෙමි.

- ආසියාවේ ප්‍රධාන රටවල් වන ඉන්දියාව, චීනය, පාකිස්ථානය හා ජපානය සමඟ සම-සම්බන්ධතා ඇති කර ගන්නා අතරේ, තායිලන්තය, ඉන්දුනීසියාව, කොරියාව ආදී නැඟී එන ආසියානු රටවල් සමග භේදයකින් තොරව මිතුරු සම්බන්ධතා වැඩි දියුණු කරන්නෙමි.

- අසල්වැසි ඉන්දියාවේ ඇති විවිධත්වය මනාව තේරුම් ගනිමින් අපගේ ඉන්දියානු පිලිවෙත සකස් කර ගනිමි. ආර්ථික හා සංස්කෘතිය වශයෙන් ඉන්දියන් විරෝධයක් ගොඩ නොනැංවෙන හා ගැති නොවන ආකල්පයකින් වඩා සමීප සබඳතා ඇති කර ගැනීමට මම කටයුතු කරමි.

- ත්‍රස්තවාදය පරාජය කිරීමේ ක්‍රියාවලියට අදාළව මේ රටේ කිසිදු පුරවැසියෙකුට හිරිහැර කිරීමට හෝ අත තැබීමට හෝ කිසිදු ජාත්‍යන්තර බලවේගයකට මම ඉඩ නොතබන්නෙමි.

- ශ්‍රී ලංකාවට එල්ල වී ඇති මානව හිමිකම් කඩකිරීමේ චෝදනාවලට සැබෑ පිළිතුරක් ලෙස අපේ මානව හිතවාදී හා පරිසර හිතවාදී ආකල්ප රට තුළ මෙන්ම ජාත්‍යන්තරව ද ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන්නෙමි. ඉන්දීය බෞද්ධයින් මෙන් ම ආසියාවේ බෞද්ධයින්ගේ දැනුම හා ශික්ෂණය බෙදා හරින මධ්‍යස්ථානය බවට ශ්‍රී ලංකාව නැවත පත් කරන්නෙමි. බටහිර උගත් සමාජය ආමන්ත්‍රණය කරමින් අවිහිංසාව, සමානාත්මතාවය හා මහා කරුණාව සියල්ලන් වෙත පළ කළ බුදු දහම හා එහි අනිත්‍යවාදී අනාත්මවාදී දැක්ම ප්‍රචලිත කිරීමට අවශ්‍ය පසුබිම මහා සංඝරත්නයේ අනුශාසනා මත මම සිදු කරන්නෙමි. එමඟින් ශ්‍රී ලංකාව පිළිබඳ නව ප්‍රතිරූපයක් ලෝකය තුළ ගොඩනඟා ගත හැකි වනු ඇත.

- විදේශ කටයුතු අමාත්‍යාංශය හා මහ බැංකුව විසින් විවිධ පුද්ගලික ආයතන හා පුද්ගලයින් වෙතට ලබාදී ඇති කොන්ත්‍රාත් හා උපදේශන සේවා සහ වෙනත් පහසුකම් පිළිබඳව සොයා බලා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සූදානම් කරන්නෙමි.



# 08.

# විරැකියාව දුරු කරන කර්මාන්ත හා සේවා

**දේශීය ආයෝජනකරුවන්ට විශේෂ බදු සහන හා ප්‍රමුඛතාවන්. මධ්‍යම හා සුළු පරිමාණ දේශීය ව්‍යාපාර ගොඩනැඟීමේ විශේෂ සැලැස්මක්. සුළු ධීවර ප්‍රජාවගේ ගැටලු සියල්ලට විසඳුම්. දේශීය හා විදේශීය රැකියා දස ලක්ෂයක්. උපාධිධාරීන් විදිමත් රැකියා.**

ස්වාභාවික සම්පත් හා මානව සම්පත්වලින් අනූන රටක් වන ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා සේවාවන් ලබා ඇති ප්‍රගතිය ගැන අපට කිසිසේත්ම සෑහීමකට පත්වීමට නොහැකිය. නිදහස් අධ්‍යාපනයේ හා සෞඛ්‍ය සේවයේ ප්‍රතිලාභ උපරිම ලෙස රටට නෙලා ගැනීමට නොහැකිවී ඇත්තේ ඒ නිසාය. වඩාත්ම ඉහළ කුසලතා දක්වන පිරිස රට හැර යන අතර අනේක් තරුණයන් උගත්කමට හරියන රැකියාවක් නොමැතිකම නිසා කැරලි දක්වා

තල්ලු වේ. මේ තීරණාත්මක මොහොතේ පවතින ව්‍යසනකාරී ක්‍රමය වෙනස් කිරීමට ජාතික ආණ්ඩුවක් හරහා මම නිසි පියවර ගන්නෙමි.

**ඒ අනුව,**

- රටේ ස්වාභාවික, පාරිසරික හා ඛනිජ සම්පත් සහ මානව සම්පත්වලින් උපරිම ඵල නෙලා ගැනීම සඳහා රටට උචිත දේශීය හා විදේශ ආයෝජන ලබාගැනීමට සුදුසු උපාය මාර්ගික සැළැස්මක් සැකසීමට මම කටයුතු කරන්නෙමි. විනිවිදභාවයකින් යුතුව හා සාධාරණ කොන්දේසි මත සිදුවන ආයෝජන සඳහා බාධාවකින් තොරව ක්‍රියාත්මක වීමේ කාර්යක්ෂම යාන්ත්‍රණයක් සැකසේ. එහිදී රටේ සම්පත් මත පදනම් වූ තත්ත්වයෙන් උසස් නිෂ්පාදන සඳහා විදේශ වෙළඳ පොළක් නිර්මාණය කර ගැනීමට, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඒකාබද්ධතාවයෙන් යුත් විශේෂ වැඩපිළිවෙලක් උපාය මාර්ගිකව ගොඩනැංවේ.

- දේශීය ආයෝජනකරුවන්ගේ සැළකිය යුතු දායකත්වයකින් යුතුව සිදුකරන තාක්ෂණික හුවමාරු ව්‍යාපාර, දේශීය වශයෙන් අගය එකතු කිරීමේ ව්‍යාපාර, හා දේශීයව නිමි භාණ්ඩ නිපදවන ව්‍යාපාර වෙනුවෙන් විශේෂ බදු සහන හා ප්‍රමුඛතාවන් ලබාදෙනු ඇත.

- සුළු හා මධ්‍යම පරිමාණ දේශීය ව්‍යාපාර ගොඩනැඟීමේ විශේෂ සැලැස්මක් සකස් කිරීමට මම කටයුතු කරමි. ඒ සඳහා වූ නවීන, කාර්යක්ෂම යෝග්‍ය තාක්ෂණය, උසස් ප්‍රමිතිය, වෙළඳ පොළ සඳහා ප්‍රවේශය, කාර්යක්ෂම මූල්‍ය හා සේවක පරිපාලනය, සහ පුහුණු ශ්‍රමය සුලභ කිරීම සඳහා අවශ්‍ය කුසලතා ලබාදෙන තාක්ෂණික ප්‍රතිපත්තියක් හා ආයතනික රාමුවක් සකස් කෙරේ. ඒ සඳහා මූල්‍ය පහසුකම් ලබා දිය හැකි විශේෂ රාජ්‍ය-පෞද්ගලික බැංකු ඒකාබද්ධ ක්‍රමවේදයක් සකස් කෙරේ.

- ශ්‍රී ලංකාවේ සෑම ගමකටම එම ගමට ආවේණික පාරම්පරික හා නවීන කර්මාන්ත වල පුනර්ජීවනය සඳහා අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික පහසුකම් විධිමත් ක්‍රමවේදයකට ලබාදීම සඳහා කටයුතු කරන්නෙමි.

- ජාත්‍යන්තර වෙළෙඳපොළට නැවත පිවිසීම සඳහා අපනයනය සඳහා භාණ්ඩ නිපදවන්නන් හට බදු සහන සමඟ බලශක්ති සහන ලබාදෙන්නෙමි. අපේ අපනයන විවිධාංගිකරණයට ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආදී නව අපනයන ක්ෂේත්‍ර වැඩි දියුණු කිරීමට ද මම කටයුතු කරමි. අපේ අපනයන වෙළෙඳපොලින් 55% ක්ම යුරෝපය හා උතුරු ඇමරිකාවයි. එය ආසියාව, දකුණු ඇමරිකාව හා අප්‍රිකාව ආදී මහාද්වීප වෙත පුළුල් කිරීම උදෙසා රටේ මූලික අවධානය යොමු කරන්නෙමි.

- අමු තේ දළු කිලෝවක් සඳහා රුපියල් 80-90 අතර පාවෙන මිළක් හා රබර් සඳහා රුපියල් 350 ක මිළක් පවත්වාගෙන යාමට කටයුතු කරමි.

- ආනයන ආදේශක තනන ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා ඒකාබද්ධ බැංකු ක්‍රමයක්, මධ්‍යගත අලෙවිකරණ සැලැස්මක්, ඒකාබද්ධ තාක්ෂණික සැලැස්මක්, හා පොදු ව්‍යවසාය නැංවීමේ සැලැස්මක්, රජය හා පුද්ගලික අංශය එක්කර සකස් කරන්නෙමි.

- රටේ සමස්ත ධීවර කර්මාන්තයම අර්බුදයකට යොමු කර වූ යුරෝපීය වෙළෙඳපොල සඳහා වන තහනම ඉවත් කර ගැනීමට කටයුතු කරන අතර දීර්ඝ කාලයක් පුරා නොවිසඳුණු සුළු ධීවර ප්‍රජාවගේ ගැටලු සියල්ල නව රජයේ ප්‍රමුඛ කටයුත්තක් සේ සලකා වහා විසඳුම් ලබා දීමට කටයුතු කරමි. ධීවර යාත්‍රා, දැල්, ආම්පන්න සහ බෝට්ටු ඇන්ජින් සඳහා පනවා ඇති අධික බදු ඉවත් කෙරේ. විදේශ ධීවර යාත්‍රා ලංකා මුහුදු සීමාව ආක්‍රමණය කිරීම වැළැක්වේ.

  මහා මුහුදේදී ජීවිතය අහිමි වන ධීවරයෙකු වෙනුවෙන් රුපියල් දස ලක්ෂයක රක්ෂණාවරණයක් රජයේ දායකත්වය ද ඇතුව ලබාදෙන්නෙමි. ධීවර ප්‍රජාව සඳහා නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කෙරේ.

- රුපියලේ විනිමය වටිනාකම හෑල්ලු වන ආනයන වියදම් සීමා කරන අතර, රට තුළ නිෂ්පාදනය කළ හැකි දේ උපරිම ලෙස නිෂ්පාදනය කිරීමට කටයුතු කරන්නෙමි. ඖෂධ, පිටි, කිරිපිටි, සීනි ආදී ආහාර ද්‍රව්‍ය වල සැපයීමේ සුරක්ෂිතතාව සහතික කරමි. එම අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය, වෙළෙඳ අවියක් ලෙස යොදා ගන්නට කිසිදු බලවේගයකට ඉඩ කඩ ලබා නොදෙමි.

- සේවා ආර්ථිකය පුළුල් කිරීමත් විදේශ ආයෝජන සඳහා ලාභ ශ්‍රමය සහතික කිරීමත් පරිසර නීති ලිහිල් කිරීමත් ලෙස වූ 1977 සිට අනුගමනය කළ ආර්ථික උපායමාර්ගය වෙනුවට නව උත්පාදන ආර්ථිකයක් වෙතට රට යොමු කරන්නෙමි. ඉහළ ගණයේ තාක්ෂණයන් මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට උචිත හරිත තාක්ෂණයන් වැනි තාක්ෂණයන් ද රට තුළ සැබෑ ලෙස ප්‍රචලිත කෙරේ.

- අපේ තරුණ පරපුරේ අසහනයට මුල්වී ඇති විරැකියාව සහමුලින් තුරන් කිරීම උදෙසා මෙම උපායමාර්ග මඟින් ඉලක්ක කරගත් දේශීය හා විදේශීය රැකියා දස ලක්ෂයක් සැපයීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නෙමි.

- විදේශ රැකියාවන්හි නියුතු සේවක සේවාකාවන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කරමි. ඔවුන්ගේ මෙරට අනේවාසික ගිණුම් සඳහා 2.5% පොලියක් දැනට ඇති පොලියට එකතු කෙරේ. මැද පෙරදිග ඇතුළු පිටරටවල ශ්‍රමය කැප කරන ශ්‍රී ලාංකිකයින්ගේ පවුල් රැක බලා ගැනීම සඳහා විශේෂ පවුල් සුරැකුම් වැඩ සටහනක් ආරම්භ කෙරේ.

# 9.
# දියුණු හා වගකීම් සහගත රාජ්‍ය අංශයක්

රාජ්‍ය අංශයේ දැනට ඇති ඵලදායීත්වය පිළිබඳව අපට තෘප්තිමත් විය නොහැක. රජයේ සේවකයන් ද දැඩි අතෘප්තිකර තත්වයකින් පසුවේ. එම තත්වය වෙනස් කර රාජ්‍ය සේවකයන්ගේ ජීවන තත්වය සහ කාර්යාල සේවයේ තෘප්තිය ඉහළ නැංවීම සඳහා ද ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නෙමි.

**ඒ අනුව,**

- රාජ්‍ය සේවයේ ඵලදායකත්වය ඉහළ නංවමින් ඉලක්කගත අභිමතාර්ථයන් ඉටු කරගත හැකි පරිද්දෙන් හා ඇගයීමට ලක්කළ හැකි ලෙසින් කළමනාකරණ විධික්‍රමය හා පරිපාලන රටාව නව පරිවර්තනයකට ලක් කරන්නෙමි.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රදේශයේ ප්‍රමුඛ කර්තව්‍යය ඉටු කරන ප්‍රධානම ඒකකය බවට පත් කෙරේ. ප්‍රදේශයේ ආර්ථික, සමාජීය, කාර්මික, හා සංස්කෘතික අංශවල සංවර්ධනයට අදාල කුසලතා වර්ධනය හා සම්පත් සැපයීම ආදී සියලු ක්‍රියාකාරකම් එමඟින් සම්බන්ධීකරණය කෙරේ.

- අර්ධ රාජ්‍ය සේවය හා බැඳුණු ආයතනවල සේව්‍ය හා සේවක කාර්මික සම්බන්ධතාවයන් ඒ ඒ පාර්ශවයන්ගේ සාකච්ඡා මාර්ගයෙන් සිදුවන කල්පවත්වා ගිවිසුම්ගත සම්බන්ධතාවයන්ට යොමු වන පරිද්දෙන් නව නීති සකස් කරන්නෙමි. රැකියා කොන්දේසි කෙසේවත් උල්ලංඝනය නොවෙන්නා වූ යෝග්‍ය කාර්මික සාමයක් හා ස්ථාවරත්වයක් ගොඩනැංවේ.

- දින 180 ක් හා බඳවා ගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද කොන්ත්‍රාත් හා අනියම් සේවකයන් ස්ථිර කිරීමට කටයුතු කරන්නෙමි. රාජ්‍ය සේවාවේ සියළු බඳවා ගැනීම්, විභාග ක්‍රමයක් මත පදනම් කර ගනිමින් කුසලතාව මත සිදු කිරීමට අවශ්‍ය පියවර ගැනේ.

- කොන්ත්‍රාත් හා අනියම් පදනමින් රජයේ රැකියාවේ නිරත සේවකයන්ට ඉඩමක් මිලදී ගැනීමට, නිවසක් තනා ගැනීමට, මෝටර් සයිකලයක් මිලදී ගැනීමට හෝ වෙනත් හදිසි අවශ්‍යතාවකට සහන පොලී අනුපාතයක් යටතේ ණයක් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් රජයේ මැදිහත්වීමෙන් ලබා දෙන්නෙමි.

- උපායමාර්ගික වශයෙන් වැදගත් රාජ්‍ය බැංකු, බලශක්තිය, ජල සම්පාදනය, වරාය, ගුවන්තොටුපල, ප්‍රවාහනය ආදියට අදාල රජයේ ආයතන වල කළමනාකරණය විධිමත් කිරීම සඳහා සිංගප්පූරුවේ තමසෙක් ආකෘතියට අනුරූපව සැලැස්මක් ක්‍රියාවට නංවමි.

- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත කොට දේශපාලන වහල් ක්‍රියාකාරකම් සඳහා යොදවා ගෙන ඇති උපාධිධාරීන් විධිමත් සේවා ආයතනවලට අන්තර්ග්‍රහණය කොට ඔවුන්ගේ සුදුසුකම්වලට සරිලන උසස්වීම් පරිපාටියක් ස්ථාපිත කොට ක්‍රියාත්මක කරන්නෙමි.

- රජයේ සේවකයින් හට ලබාදී ඇති මෝටර් සයිකල් ලබා ගැනීමේ ණය මුදල සම්පූර්ණයෙන් කපා හැර ඔවුන් දැනට මෝටර් සයිකලය ලබා ගැනීමේ අවස්ථාවේදී ගෙවන ලද රු. 50,000 මුදල නැවත ඔවුන් වෙත ලබා දෙනු ඇත. තව ද මෝටර් සයිකලය ලබා ගැනීමට හිමිකම් තිබුණත් විවිධ ආයතනික හේතූන් මත එම අවස්ථාව අහිමි වූ රාජ්‍ය සේවකයන් හට අභියාචනා ඉදිරිපත් කර ඊට සුදුසුකම් ලැබීමට අවස්ථාව උදා කරමි.

- ශ්‍රී ලංකාවේ ධනය කොල්ලකාගෙන විදේශවලට ගෙනගොස් එහි තැන්පත් කර ඇති අය පිළිබඳව විදේශ රටවල ද සහයෝග යෙන් අන්තර්ජාතික විමර්ෂණයක් ඇරඹීමට කටයුතු කරමි. අයථා ක්‍රමයෙන් උපයාගෙන ඇති සියලු ධනය නැවත ජනතාවට ලබාදීමට ක්‍රියාකරනු ඇත.

- රාජ්‍ය බුද්ධි අංශ, දේශපාලන කටයුතු හා සිවිල් කටයුතුවලට මැදිහත් කරලීම නීතිය මගින්ම තහනම් කරන්නෙමි.

- සිවිල් ආරක්ෂක සේවාවේ නිලධාරීන් සියල්ලගේම සේවය ස්ථිර කරන අතර ආරක්ෂක අංශ වල සියලු නිලධාරීන් වෘත්තියේ ගෞරවයට නොගැළපෙන රැ


නියාමිලු යෙදවීම නවතා සේවයේ ගෞරවනීය බව ආරක්ෂා කර දෙන සමාජ සේවාවන් වලට යොමු කෙරේ. දැනට සිදුකරන දේශපාලන නායකයන්ගේ නිවෙස්වල බැල මෙහෙවර කිරීමේ ක්‍රමය සම්පූර්ණයෙන් නවතා දමමි.

- රාජ්‍ය සේවයට මුවාවී විවිධ පුද්ගලයින් හා ආයතන සතුව ඇති සියලු නීති විරෝධී අවි ආයුධ අත් අඩංගුවට ගැනීමට කටයුතු කරමි. නීති විරෝධී සන්නද්ධ කල්ලි විසුරුවා හරිනු ලබන අතර, ඒයට නායකත්වය දෙන හා රාජ්‍ය දේපළ ඒ සඳහා යොදා ගන්නා අයට දැඩිව නීති රීති ක්‍රියාත්මක කෙරේ.

  කොටි සංවිධානයේ අවි ආයුධ, මිල මුදල්, විදේශ වත්කම් ආදිය පිළිබඳ විධිමත් සංගණනයක් කර ඒවා රාජ්‍ය සේවයට මුවාවී නීති විරෝධීව අත්පත් කරගෙන ඇති අයට තරාතිරම නොබලා දඬුවම් දී ඒ සියලු අවි හා දේපළ රාජ සන්තක කිරීමට කටයුතු කරමි.

- රාජ්‍ය ආරක්ෂක අංශ, පුද්ගලික ආරක්ෂක සේවා සමඟ එක්ව සිදුකරන නීති විරෝධී මුහුදු හා ගොඩබිම් ආරක්ෂක කටයුතු වහාම නතර කිරීමට කටයුතු කරන්නෙමි. තවද මෙතෙක් ඒවායේ නීති විරෝධීව කටයුතුවල නියැළුණු පුද්ගලයන් හට දැඩි දඬුවම් ලබාදීමට කටයුතු කෙරේ.

- හිටපු හමුදාපති ජෙනරල් සරත් ෆොන්සේකා මහතා සහ 43 වැනි අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායක මහත්මිය ඇතුළු දේශපාලන පළි ගැනීම් හා දඬුවම්වලට ලක්වූවන්ට අහිමි වූ තනතුරු හා අයිතිවාසිකම් යළි ලබාදෙන්නෙමි.



**මෛත්‍රී**
**පාලනයක්...**
ස්ථාවර රටක්

# 10.
# බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක්

**ඉන්ධන වලින් රජය අයකරන රු කෝටි 4000 කට අධික බදු ඉවත් කර ඉන්ධන මිළ අඩු කෙරේ. පොදු ප්‍රවාහන සේවා, ත්‍රී වීල් හා මෝටර් බයිසිකල් සඳහා විශේෂ සහන ලැබේ. ඉන්ධන සහ විදුලි සඳහා මිළ සූත්‍රයක් සැකසේ. සාධාරණ ක්‍රමවේදයකට රජයේ හා පුද්ගලික අංශයේ පොදු බස් හා දුම්රිය සේවා වැඩිදියුණු කර ඒකාබද්ධ කාලසටහනක් සැකසේ.**

රටේ අනාගතය තීරණය වන ප්‍රධානම සාධකයක් වන්නේ බලශක්තියයි. ප්‍රවාහන ක්ෂේත්‍රය සහමුලින්ම රඳා පවතින්නේ ආනයනය කරන ඛනිජතෙල් මතය. විදුලිය නිශ්පාදනයේ ද සියයට හැටක් හැත්තෑවක් පමණ රඳාපවතින්නේ ආනයනය කරන ඛනිජ තෙල් හා ගල් අඟුරු මතය. වැඩිවන ඉල්ලුම අනුව ඉදිරි වසර පහළොව තුළ ශ්‍රී ලංකාවේ විදුලිය හා ඛනිජ තෙල් ඉල්ලුම දෙගුණයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දැනට ගල් අඟුරු හා ඛනිජ තෙල් මිළ දී ගැනීම ක්‍රියාපටිපාටිය දූෂිත වන අතර එය ලංකාවේ සිදුවන මහා පරිමාණ වංචාවක් වේ. එම නිසා අතලොස්සකගේ මඩි තරවන අතර විපතට පත්වන්නේ බලශක්තිය පරිභෝජනය කරන සාමාන්‍ය ජනතාවයි. මෙම තත්වය සපුරා නවතා ජනතාවට ප්‍රතිලාභ ලබාදීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගනිමි.

ඒ අනුව,

- ලෝක වෙළඳපොලේ ඛනිජ තෙල් මිල පහළ ගොස් ඇති මේ මොහොතේ ක්ෂණික විසඳුමක් ලෙස ඉන්ධන වලින් රජය අය කරන රුපියල් කෝටි 4000 කට අධික බදු ඉවත් කර එහි වාසිය ජනතාවට ලබාදීමට කටයුතු කරමි. පොදු ප්‍රවාහන සේවා, ත්‍රී වීල් හා මෝටර් බයිසිකල් සඳහා විශේෂ සහන ලබාදෙමි. ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිළ රුපියල් 300 කින් අඩු කෙරේ.

- මෙම ගැටළුවට ස්ථිරසාර විසඳුමක් ලෙස ඉන්ධන සහ විදුලි සඳහා පාරිභෝගිකයා ගෙවන මිල, විනිවිද පෙනෙන මිල සූත්‍රයකට අනුව සකස් කර දින සීයයක් ඇතුළත ක්‍රියාවට නංවන්නෙමි. එවිට වෙළඳ පොළේ මිළ පහත යන වකවානුවලදී එහි වාසිය මහජනයා වෙත ලැබෙනු ඇත.

- එමෙන්ම බාල ඛනිජ තෙල් ආනයනයේදී හා ගල් අඟුරු මිල දී ගැනීමේ දී සිදුකර ඇති අක්‍රමිකතා විමසා බලා විනිවිද පෙනෙනසුලු ආකාරයට ඛනිජතෙල් හා ගල් අඟුරු මිල දී ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් වහාම යොදන්නෙමි.

- මෑත කාලයේදී විදුලි බලාගාර ඉදිකිරීම සඳහා නියමිත වියදමට වඩා 50% කට වඩා වැඩි මුදලක් වැය කර අක්‍රමිකතා සිදුකර ඇති බැවින් එම තත්වය වෙනස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නෙමි. ප්‍රවාහන හා බලශක්ති ක්ෂේත්‍රවලට අදාළව ආසියාවේ ආශ්චර්යය ලෙස පෙන්වන අධිවේගී මාර්ග, දුම්රිය මාවත්, වරාය, ගුවන් තොට, බලාගාර, ජලාශ ආදී මෙගා සංවර්ධන ව්‍යාපෘති හරහා අපේ රට මේ වනවිට ආර්ථික ලෙස බංකොලොත් වී ඇත. මේවා ජාතික මංකොල්ලයන් වන අතර මේවා විශ්වාස කළ නොහැකි පරිමාණයේ වංචාවන් ය.

- ඉහළ යන ඉන්ධන මිල හා දිනෙන් දින උග්‍රවන පරිසර ප්‍රශ්න නිසා බලශක්ති සුරක්ෂිතතාව පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්නෙමි. දර විදුලිය (ඩෙන්ඩ්‍රෝ), සුළං බලය, සූර්ය බලය, සමුද්‍ර ශක්තීන් ආදී පුනර්ජනනීය බලශක්ති ප්‍රභවවලින් රටේ ජනතාවගේ මූලික බලශක්ති අවශ්‍යතාවයන් සහමුලින්ම පාහේ සපුරාග ැනීමට අවශ්‍ය පසුබිම සකස් කරන්නෙමි. විශේෂයෙන් මෙතෙක් කලක් ගල් අඟුරු හා ඛනිජතෙල් මාෆියාව වෙත ඇදී ගිය විදුලි පාරිභෝගිකයාගේ මුදල් ග්‍රාමීය ප්‍රදේශවල ගොවිජනතාව වෙත ගලායාම සඳහා රට පුරා දර විදුලි බලාගාර ස්ථාපිත කිරීම කිරීමට කටයුතු කරන්නෙමි. එමඟින් විදුලිය නිපදවීම ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නංවන ප්‍රධාන මාර්ගයක් බවට පත් කරන්නෙමි.

- දැනට පොසිල ඉන්ධන සඳහා ලබාදෙන සියලු සහනාධාර ක්‍රමානුකූලව ඉවත් කර එම සහන පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන්

සඳහා ලබා දී පාරිභෝගිකයාට අඩු මිලට බලශක්ති සැපයීමට අවශ්‍ය කටයුතු කරමි. එහිදී ලෝකයේ ස්ථාපිත කර ඇති පිරිසුදු බලශක්තිය සඳහා වන දිගුකාලීන සහන ණය අප රටේ පුනර්ජනනීය බලශක්තිය සංවර්ධනය සඳහා ලබාගැනීමට කඩිනම් වැඩපිළිවෙලක් දියත් කරන්නෙමි.

- ශ්‍රී ලංකා මුහුදේ තිබෙන බවට හඳුනාගෙන ඇති ඛනිජ සම්පත් සංවර්ධනය සඳහා දැනට දියත් කර ඇති වැඩසටහන සම්පූර්ණයෙන්ම සමාලෝචනය කරමි. එම සම්පත් කුණු කොල්ලයට විදේශ සමාගම්වලට පැවරීමට දරණ ප්‍රයත්නය නවතා විධිමත් විනිවිද පෙනෙන සුළු දිගු කාලීන වැඩ පිළිවෙලක් සම්පාදනය කරන්නෙමි.

- බලශක්තිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීමට යොමු කරන වැඩ පිළිවෙලක් මම දියත් කරන්නෙමි. බලශක්ති සංරක්ෂණයට අදාල යටිතල ව්‍යුහයන් සහ නවීන තාක්ෂණයන් භාවිතා කිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් සම්පාදනය කරමි. නිවාස සහ ගොඩනැගිලි සැලසුම් ද බලශක්ති සංරක්ෂණය මූලික කරගෙන සැකසෙන වැඩපිළිවෙලක් ලෙස දියත් කෙරේ.

- රටේ දැවෙන ප්‍රශ්නයක් බවට පත්ව ඇති ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා ස්ථිරසාර විසඳුමක් ලබා දෙන්නෙමි. පුද්ගලික අංශයේ පොදු ප්‍රවාහන සේවාවල ඵලදායිතාව පහළ යාමට හේතුපාදකවී ඇති තැරැව්කාරයින්ගේ මැදිහත්වීම සම්පූර්ණයෙන්ම මැඩපවත්වා මගීන් සඳහා ඉහළ සේවාවක් ලබාදීමට කටයුතු කරමි. ඉන්පසු සාධාරණ ක්‍රමවේදයකට රජයේ හා පුද්ගලික අංශයේ බස් හා දුම්රිය සේවා ඒකාබද්ධ කාලසටහනකට අනුව සිදුකිරීමට කටයුතු කෙරේ.

- මහාමාර්ග වල පොදු ප්‍රවාහන සේවා පද්ධති ශක්තිමත් කිරීමට සහ දුම්රිය සේවා වැඩිදියුණු කිරීමට කටයුතු කෙරේ. මහා මාර්ග හා දුම්රිය මාර්ග පද්ධතිය පුළුල් සඳහා යොදා ගන්නා ආයෝජනයන්, ප්‍රවාහනය ආශ්‍රිත දේශිය කර්මාන්ත නංවාලීමට දායක කරගන්නා අතර එමඟින් දේශිය අගය එකතු කිරීම ඉහළ නැංවේ. දේශිය දැනුම හා කුසලතා ද වර්ධනය වේ. මේ අනුව, විදේශීය ණය බර ඉහළයාම අවම කිරීමට ද ක්ෂෙත්‍රයේ තිරසාර වර්ධනය සහතික කිරීමට ද හැකිවේ.

- පොදු ප්‍රවාහනය 60% ක සේවාවක් සපයන නමුදු ඊට භාවිතා කරන්නේ තෙල්වලින් 15% ක් පමණි. එමනිසා පොදු ප්‍රවාහන සේවය දියුණු රටවල මෙන් ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව ඉහළ නැංවීමෙන් අනතුරුව මහාමාර්ග වල පුද්ගලික වාහන භාවිතය අධෛර්ය කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් හඳුන්වාදෙනු ලැබේ. වාහනවල ඉන්ධන කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ප්‍රමිති



8-

හඳුන්වාදීමට, රියදුරු අධ්‍යාපනයට, හා විදුලි දුම්රිය සහ විදුලි වාහන භාවිතයට නැඹුරුවීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ.

- නගර සහ රට සැලසුම්කරණය කිරීමේ දී ප්‍රවාහන අවශ්‍යතාව අවම වන පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා මම පියවර ගනිමි. ඒ සඳහා ජනාවාස සංකේන්ද්‍රණය කර ඊට අවශ්‍ය යටිතල පහසුකම්, පාසල්, රජයේ සේවා ස්ථාන, සෞඛ්‍ය සේවා, රැකියා ස්ථාන, කුඩා කර්මාන්ත, වෙළඳපොල ආදිය ලබාදේ. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම්, ප්‍රවාහනය අවම කිරීම උදෙසා ඵලදායී අයුරින් භාවිතා කිරීමට පසුබිම සැකසේ.

- විශේෂ බදු සහන යටතේ ගෙන්වනු ලැබූ අධි සුඛෝපභෝගී මෝටර් රථ හා රේසින් කාර් හා මෝටර් බයිසිකල් පිළිබඳ සොයා බැලීමක් කර, අදාළ බදු අයකර ගැනීමට ක්‍රියාකරන්නෙමි.

# 11.

# අර්ථවත් හරවත් මාධ්‍ය නිදහසක්

**රජයේ ජනමාධ්‍ය, රට පාලනය කරන දේශපාලන පක්ෂයේ ප්‍රචාරක අවියක් බවට පත් කිරීම වහාම නවතා සමබර සේවාවක් රටට සැපයීමට අවශ්‍ය පසුබිම සකස් කරමි. ජනමාධ්‍ය නිදහස තොරතුරු දැනගැනීමේ අයිතිය උපරිම ලෙස තහවුරු කරමි.**

වර්තමාන සමාජයේ මිනිසාගේ සෑම ක්‍රියාකාරකමක්ම ජනමාධ්‍යකරණයට ලක්වී ඇත. එමෙන්ම ජනමාධ්‍ය වාණිජකරණයට සහ අධිපතිබල රටාවන්ට නතුවී ඇත. තොරතුරු දැනගැනීමේ අයිතිය විවිධාකාරයෙන් සීමාවී ඇති අතර සත්‍ය කතාකිරීමෙහි ලා ස්වයංවාරණ පනවා ගැනීම මාධ්‍යයේ සුලභ ලක්ෂණයක් වී ඇත. මාධ්‍ය ග්‍රාහකයා වැදගත් තොරතුරුවලින් ජීවිතයට අවශ්‍ය දැනුමින් හා උසස් සංස්කෘතික වින්දනයකින් පොහොසත් කරනවා වෙනුවට සරල වාණිජ විනෝදයක ගිල්වා තැබීමට ජනමාධ්‍ය කටයුතු කර තිබේ. සමාජ අවධානය යොමුවිය යුතු හා ලැබිය යුතු දෑ සඟවා තබා හරසුන් දේ උලුප්පා දමයි. කලා නිර්මාණවල බුද්ධිමය දේපල අයිතිය උල්ලංඝණය කෙරෙමින් තිබේ.

**එම නිසා,**

- සියලු ජනමාධ්‍යකරුවන්ගේ හා ආයතනවල නිදහස ආරක්ෂා වන කෙටි කාලීන හා දීර්ඝ කාලීන වැඩපිළිවෙළක් දියත් කරන්නෙමි.

- ජනමාධ්‍ය නිදහස හා තොරතුරු දැනගැනීමේ අයිතිය උපරිම ලෙස තහවුරු කරමින් මහජන සේවා සන්නිවේදන දිරිමත් කිරීමේ පදනම මත හිඳ රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය නියාමනය කිරීමේ කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කරමි.

- රජයේ ජනමාධ්‍ය රට පාලනය කරන දේශපාලන පක්ෂයේ ප්‍රචාරක අවියක් බවට පත් කිරීම නවතා, සමබර සේවාවක් රටට සැපයීමට අවශ්‍ය පසුබිම සකස් කරමි.

- දියුණුවන සන්නිවේදන තාක්ෂණයත් සමාජ මාධ්‍යයන්හි ව්‍යාප්තියත් සමාජ යහපතටම හේතුවන පරිදි කළමනාකරණය කර ගැනීම සඳහා මාධ්‍ය සංවර්ධන ප්‍රතිපත්තියක් බලගැන්වීමට ද කටයුතු කරමි.

- පාර්ලිමේන්තුවේ රැස්වීම් සජීවී ලෙස රූපවාහිනී මාධ්‍යයෙන් විසුරුවා හැරීමට කටයුතු කරමි.

  මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවලට, ඒවායේ හිමිකරුවන්ට හා මාධ්‍යවේදීන්ට සෘජුව හා වක්‍රව සිදුකරනු ලබන බලපෑම් හා බියගැන්වීම්, සුදු වෑන්වලින් පැහැර ගැනීම් හා මරා දැමීම් නවතා නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සහතික කරන්නෙමි.

- නොමිලේ අන්තර්ජාලය ලබාදීම සඳහා සෑම නගරයකම ප්‍රසිද්ධ ස්ථානවල වයිෆයි කලාප ඇති කරමි.

මගේ පාලන කාලය ඇතුළත ඉහත කී දේශපාලන ප්‍රතිසංස්කරණයන් හා ආර්ථික හා සමාජ වැඩපිළිවෙළ සම්පූර්ණ යථාර්ථයක් කිරීමට මම බැඳී සිටිමි. ඒ සඳහා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලනය පක්ෂත් ජනතා සංවිධානත් සමඟ සම්මුතියක් ඇති කර ගනිමි.

එමෙන්ම අප යෝජනා කරන දේශපාලන ප්‍රතිසංස්කරණයෙන් පසුව පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂ වල එකඟතාව ඇතිව පාර්ලිමේන්තු මැතිවරණයක් කැඳවීමට මම ක්‍රියා කරමි. එහිදී සෑම දේශපාලන පක්ෂයකටම සම අවස්ථා උදා කරන සාධාරණ මැතිවරණ ක්‍රියාවලියක් ඇති කිරීමට මම සහතික වෙමි.

මා විසින් ඉදිරිපත් කරනු ලැබූ නව ප්‍රතිපත්තීන් මත පිහිටා ආණ්ඩුවක් පිහිටුවීමට අවශ්‍ය යුක්ති සහගත දේශපාලනය පරිසරයක් නිර්මාණය කරදීමට මම බැඳී සිටිමි. මහ මැතිවරණයකින් පසු පත් වන ආණ්ඩුව ජාතික සමගි සන්ධානයක් වශයෙන් ගොඩනැඟීම මම කැප වෙමි.

ශ්‍රී ලංකා-යූඑන්පී පක්ෂ භේදය, සිංහල-දෙමල-මුස්ලිම් ජාතිභේදයන් ද පංති-ආගම්-කුල භේදයන් ද දුරුකර විසි එක් වැනි සියවසට ඔබින නූතනත්වයෙන් පිරිපුන් රටක් නිර්මාණය කිරීම මාගේ එකම අභිලාශයයි. එය මාගේ පරම යුතුකම ලෙස ද සලකමි.

අවනීතිය - යුක්ති ධර්මයෙන් ද

අශීලාචාර බව - ආචාරශීලීත්වයෙන් ද

මුග්ධ පවුල්කාමය - උතුම් ප්‍රඥාවෙන් ද

වෛරය - මෛත්‍රියෙන් ද ජය ගනිමු

**ඔබ සැමට මෛත්‍රී සහගත**

**සමාජයක් උදා වේවා**

මෛත්‍රීපාල සිරිසේන

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

REFERENCE

මුද්‍රණය :- ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව